# සංගීතය (පෙරදිග)

# 11 ශ්‍රේණිය

## කාර්ය පත්‍රිකා සංග්‍රහය




කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර

| | |
|---|---|
| විෂය | : පෙරදිග සංගීතය ශ්‍රේණිය:-11 |
| පාඩම් ඒකකය | : බිලාවල්,භූපාලි,කාෆි,යමන්,භෛරවී,යන රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාස සහ තානාලංකාර |
| ගුරුවරයාගේ නම: බී.ජී.ඒ.සංජීවනී | පාසල:-අම්/මඩවලලන්ද මහ විදුහල |

## රාග හඳුනා ගැනීම

| | |
|---|---|
| බිලාවල් | සියලුම ස්වර ශුද්ධයි.සම්පූර්ණ ජාතී රාගයකි.සරිස,මගමරිස,ගපනිනිස යන ස්වර සංගති යෙදේ. |
| භූපාලි | සියලුම ස්වර ශුද්ධයි.ම,නි යන ස්වර වර්ජිතයි. ඖඩව ජාතී රාගයකි.සධ ,සරිග,ගපධප,ගරිසරිස යන ස්වර සංගති යෙදේ. |
| කාෆි | සම්පූර්ණ ජාතී රාගයකි. ග,නි යන කෝමළ ස්වර යෙදේ.රිගරිමගරිස,සරිග,සරිප,සසරිරිගග යන ස්වර සංගති යෙදේ. |
| යමන් | සම්පූර්ණ ජාතී රාගයකි.ම් යන තීව්‍ර ස්වරය යෙදේ.නිධ, නිරිස.නිරිගම්,පරිස |
| භෛරවී | සම්පූර්ණ ජාතී රාගයකි. රි,ග,ධ,නි යන ස්වර 4ම කෝමළව යෙදේ.ගගරිස, සරිගම, නිසගම, සධපධ යන ස්වර සංගති යෙදේ. |

රාගයක මධ්‍යලය ගීතය ගායනයෙන් අනතුරුව, තාන හෙවත් තානාලංකාර ගායනා කෙරේ.තානාලංකාර යනු රාගයේ ස්වර විචිත්‍ර ආකාරයෙන්,නිර්මාණශීලීව ස්වර බඳිමින් කාලයට අනුව ගායනය වාදනය කිරීමයි. තානාලංකාර ගායනය /වාදනයකිරීම සඳහා, හොඳ රාග ඥානයක්, ස්වර ඥානයක්,තාල ඥානයක් තිබිය යුතුය. ගායකයාගේ හෝ වාදකයාගේ දක්ෂතාවය මත කොතෙකුත් තානාලංකාර නිපදවිය හැකිය.තානාලංකාර යොදාගන්නා ආකාර කිහිපයක් වේ.එනම්,

01.ශුද්ධ හෙවත් සපට් තාන:-රාගයේ ආරෝහණ අවරෝහණ ස්වරූපය ඉස්මතු කිරීම

උදා:-සරි ,ගම ,පධ ,නිස ,/සනි ,ධප ,මග ,රිස (බිලාවල් රාගය)

02.කූට හෙවත් මිරක් තාන්:-ක්‍රමානුකූල ස්වර රටාවක් දක්නට නොලැබේ.

03.බෝල් තාන්:- ගීතයේ වචන යොදා ගනිමින් කරනු ලබන තාන

රිග ,රිම ,ගරි,සරි ,/රිප ,මප, මග ,රිස = සඳ ,වත් ,හින ,හෙන / වාS, SS, SS, SS (කාෆි)

04.ගමක් තාන්:-ස්වර ආන්දෝලනය කරමින්, සොලවමින්,ළෙලවමින්,වලනය කරමින් ගායනය කිරීම.බොහෝ දුරට සමාන ස්වර මේ සඳහා යොදා ගනී.

සස, රිරි ,ගග ,මම ,/මග, මරි ,සරි, සස / අඅ ,අඅ ,අඅ,අඅ,/අඅ,අඅ,අඅ,අඅ (බිලාවල් රාගය)

05.රාගාංගතාන:-රාග ස්වර සංගතීන් ඉතා පැහැදිලිව දක්නට ලැබේ.

මග ,මරි ,සරි ,ස- / ගප, ධනි ,ස- ස- (බිලාවල් රාගය)

06.අලංකාරික තාන:-යම් කිසි රචාවකට විචිත්‍ර අයුරින් ස්වර යොදා ගන්නා තානාලංකාර අලංකාරික තානයි.

නිරි ග,රි ගම්,ගම් / ප,ම් ගම්, ගරි, ස-

07.මිශ්‍රතාන:-ඉහතදී දක්වනු ලැබූ තාන වර්ග හයෙහි වර්ග දෙකක හෝ කිහිපයක මිශ්‍රණයෙන් සැදුම් ලද තාන මිශ්‍ර තානයි. බොහෝ විට ශුද්ධ තාන සහ කූට තාන යොදා ගනී.

## කාර්ය පත්‍රිකාව

❖ " අ,, තීරුවේ සඳහන් රාග සඳහා ස්වර සංගති "ආ,, තීරුවෙන් ගලපා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රාගය | ස්වර සංගති |
|---|---|
| A | නිරිස,ගම්පම්,ගරිස |
| B | සස,රිගු,රිම,ගුරි,ස- |
| C | සරි,ගුම,ගුරි,සරි,සනි |
| D | ගපධනි,සනිධප,මගමරි |
| E | සධ.සරිග.ප.ගරිස |

❖ වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01.ඉහත ස්වර සංගති අනුව, විකෘති ස්වර කිසිවක් නොයෙදෙන රාග යුගලය වන්නේ,

I. AසහB 2. A සහC 3. Dසහ E 4. AසහE

02.ඖඩව ජාති රාගයකි.

1. A 2. B 3.C 4.E

03.සර්ව කෝමළ රාගයකි.

1. E 2.B 3. C 4.A

04.මධ්‍යමය සහ නිෂාධය, වර්ජිත වන රාගයකි.

1. A 2. E 3. B 4.C

05.ගාන්ධාරය සහ නිෂාධය, කෝමළව යෙදෙන රාගයකි.

1. A 2.B 3. C 4.D

06.ඉහත A B C D E F යන ස්වර සංගති වලට අදාළ රාග පිළිවෙල තෝරන්න.

1.යමන්,කාෆි,භෛරවී.බිලාවල්,භූපාලි 2.භූපාලි,යමන්,කාෆි,භෛරවී,බිලාවල්

3.කාෆි,භෛරවී,බිලාවල්,භූපාලි,යමන් 4.බිලාවල්,කාෆි,භූපාලි,භෛරවී,යමන්

07.“සරි, ගප ,ධස, / සධ, පග, රිස,, මෙම තානාලංකාරය

1.ත්‍රිතාලයට අනුව නිර්මාණය වූ,භූපාලි රාගයට අදාළ තානයකි.

2.දාදරා තාලය අනුව නිර්මාණය වූ ,බිලාවල් රාගයට අදාළ තානයකි.

3.දාදරා තාලයට අනුව නිර්මාණය වූ,භූපාලි රාගයට අදාළ ශුද්ධ තානයකි.

4.කෙහෙර්වා තාලයට නිර්මාණය වූ,මිශ්‍ර තානයකි.

08.“සස, රිරි, ගුගු, මම, ප-,, යනු

1.කාෆි රාගයේ මුඛ්‍යාංගයයි. 2.බිලාවල් රාගයේ මුඛ්‍යාංගයයි.

3.භෛරවී රාගයේ මුඛ්‍යාංගයයි. 3.භූපාලි රාගයේ මුඛ්‍යාංගයයි.

09.“සරිස,සරිගරිස,සරිගමගරිස,සරිගමපමගරිස ,,යන ස්වර පල්ටාව සුදුසු වන්නේ කුමන රාගයටද?

1.බිලාවල් 2.භූපාලි 03.කාෆි 04.යමන්

10.රාගාංග තාන යනු,

1.ස්වර යොදා ගෙන නිපදවන තානාලංකාර

2.ස්වර සංගති යොදා ගනිමින් නිපදවන තානාලංකාර

3.ගීතයේ වචන යොදා ගනිමින් නිර්මාණය කරන තානාලංකාර

4.රාගයේ වාදි ස්වරය යොදා ගනිමින් නිර්මාණය කරන තානාලංකාර

❖ පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

11.තානාලංකාර යන්න හඳුන්වන්න.

12.තානාලංකාර වර්ගීකරණය කොට ,විස්තර කරන්න.

13.භෛරවී රාගයට අදාළව,ශුද්ධ තානයක් නිර්මාණය කරන්න.

14.~~රාග~~ සර්ගම් ගී යනු මොනවාද?

15.ලක්ෂණ ගී යනු මොනවාද?

විෂයය :- පෙරදිග සංගීතය ශ්‍රේණිය :- 11

පාඩම / ඒකකය :- නිර්දේශිත තාල පද අතින් නිරූපණය

ගුරුවරයාගේ නම :- ඩබ් . ඒ. කුමුදු නිශාන්ත පාසල- අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය

## <u>නිර්දේශිත තාල</u>

### ත්‍රිතාල්

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| ඨේකාව | ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| තාල සංඥා | × | | | | 2 | | | | 0 | | | | 3 | | | |

### දීප්චන්දි

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ඨේකාව | ධා | ධිං | - | ධා | ධා | ධිං | - | තා | තිං | - | ධා | ධා | ධිං | - |
| තාල සංඥා | × | | | 2 | | | | 0 | | | 3 | | | |

### ජප් තාලය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| ඨේකාව | ධි | නා | ධි | ධි | නා | ති | නා | ධි | ධි | නා |
| තාල සංඥා | × | | 2 | | | 0 | | 3 | | |

### ලාවනී

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ඨේකාව | ධ | ගෙ | න | ති | න | ක | ධි | න |
| තාල සංඥා | × | | 2 | | 0 | | 3 | |

### දාදරා

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| ඨේකාව | ධා | ධි | නා | ධා | තු | නා |
| තාල සංඥා | | | | | | |

### බෙම්බෝ

| | | | | |
|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 |
| ඨේකාව | ධාතිධි | නාතිනා | තාතිධි | නාධිනා |
| තාල සංඥා | × | 2 | 3 | 4 |

### කෙහෙර්වා

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ඨේකාව | ධ | ගෙ | න | ති | න | ක | ධි | න |
| තාල සංඥා | × | | | | 0 | | | |

- ➢ හින්දුස්ථානී සංගීතයේ තාල අතුරින් 11 ශ්‍රේණියට නියමිත තාල 7 ඉහතින් දැක්වේ.මෙම තාල තබ්ලාවෙන් වාදනය කරන අතර අතින් තාල පද නිරූපණය අනිවාර්ය වේ. මෙහිදි තාලයක ඇති තාල සංඥා පිළිබඳව අවබෝධය ඉතා වැදගත් වේ.
- ➢ ඒ ඒ තාල සංඥා වලදී සහ මාත්‍රා වලදී තාල පදයේ අක්ෂර හඬ නගා ප්‍රකාශ කළ යුතු අතර දෙඅත්ලෙන් සහ ඇඟිලිවලින් තාල පද නිරූපණය කරන ආකාරය පහත වගුවේ පැහැදිලිව දැක්වේ.

| තාල සංඥාවේ නම | සංඥාව | දෙඅත්ලෙන් සහ ඇඟිලිවලින් සිදු කළ යුතු ක්‍රියාව |
|---|---|---|
| සමස්ථානය | × | බොහෝ විට තාලයේ ප්‍රථම මාත්‍රාව මත යෙදේ.තාලයේ ප්‍රබලම ස්ථානයයි,මෙම ස්ථානයේදී අත්පුඩියක් ගසන්න. |
| ඛලිය | 0 | තාලයේ දුර්වල ස්ථානයයි,බොහෝ විට තාලයේ මැද පිහිටයි,අත්පුඩි නොගසා අත ඉවතට යොදන්න. |
| අනුතාල | 2,3 | සම්,ඛලි හැරුණු විට සෙසු විභාග අනුතාල නම් වේ.මෙහිදී අත්පුඩියක් ගැසිය යුතුය. |
| මාත්‍රා | 1,2,3,4 | සංඥාවලට අමතරව ඇති මාත්‍රා නිරූපණය කරන්නේ වම් අත්ල මත දකුණතේ සුළැඟිල්ල, වෙදැඟිල්ල, මැදැඟිල්ල අනුපිළිවෙලට ඇඟිලි තුඩු තබන්න. |

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අත්පුඩි පහර | සුළැඟිල්ල | වෙදැඟිල්ල | මැදැඟිල්ල | අත්පුඩි පහර | සුළැඟිල්ල | වෙදැඟිල්ල | මැදැඟිල්ල | දෙඅත්ල වියෝග | සුළැඟිල්ල | වෙදැඟිල්ල | මැදැඟිල්ල | අත්පුඩි පහර | සුළැඟිල්ල | වෙදැඟිල්ල | මැදැඟිල්ල |
| ධ | ධිං | ධිං | ධා | ධ | ධිං | ධිං | ධා | ධ | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| × | | | | 2 | | | | 0 | | | | 3 | | | |

- මේ අයුරින් අනෙකුත් තාල අතින් නිරූපණය කිරීමේදී දෙඅත්ලේ සංයෝගය, වියෝගය සහ අතැඟිලි භාවිත කරමින් මාත්‍රා දැක්වීමෙන් අතින් තාල නිරූපණය කළ හැකිය.

නිවැරදි පිළිතුර තෝරන්න.

01.මාත්‍රා 14 ක් ඇති තාලය කුමක්ද ?

1.දාදරා 2.ජප් තාල් 3.දීප්චන්දි 4.ත්‍රිතාල්

02. තාලයක ප්‍රබලම ස්ථානයේ නම කුමක්ද?

1.බලිය 2.සම් 3.විභාග 4.අනුතාල

03.විෂය නිර්දේශයේ ධ, ගෙ, ක, යන අක්ෂර යෙදෙන තාලය කුමක්ද?

1.දාදරා 2.ත්‍රිතාල් 3.කෙහෙර්වා 4.බෙම්ටෝ

04.අතින් තාල නිරූපණය කිරීමේදී සමස්ථානයේ දී සිදු කරන ක්‍රියාව,

1.අත්පුඩිය 2.අත ඉවතට 3.ඇඟිලි තැබීම 4.අත් වියෝග කිරීම.

05. ධි න / ධි ධි න / ති නා /- - - මෙම හිස් තැනට යෙදිය යුතු අක්ෂර වන්නේ,

1. ධ ධි න 2. ධි ධි නා 3. ධා තු නා 4.ධා ධි

06. තබ්ලාව යොදා ගනු ලබන්නේ,

1.හින්දුස්ථානි සංගීතයේය.2.කර්ණාටක සංගීතයේය.3.නාඩගම් සංගීතයේය. 4.බටහිර සංගීතයේය

07. 2 , 3 , 4 යන අනුතාලස්ථාන වලදී සිදු කළ යුත්තේ,

1.මැදඟිල්ල තැබීම ය. 2.අත ඉවතට 3.අත්පුඩිය 4.වෙදැඟිල්ල තැබීම ය.

08.දීප්චන්දි තාලයේ බලිස්ථානය පිහිටන්නේ කිනම් මාත්‍රාව මතද

1. 4 2. 6 3. 8 4.11

09.ත්‍රිතාලයේ විභාගයක ඇති මාත්‍රා සංඛ්‍යාව වන්නේ,

1. 6 2. 5 3. 16 4. 4

10.මාත්‍රා සංඛ්‍යාවෙන් සමාන තාල පද දෙක වන්නේ,

1.දාදරා , ලාවනී 2.ජප්, කෙහෙර්වා 3.ලාවනී, කෙහෙර්වා 4.බෙම්ටො , ලාවනී

11.මාත්‍රා 10 කින් යුත් තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න.

12.නිර්දේශිත තාල පද හතෙහි නම් ලියන්න.

13.දාදරා තාලයට ගැළපෙන ලෙස ගීත පාද දෙකක් ප්‍රස්තාර කරන්න.

14.කෙහෙර්වා තාලයේ අවනද්ධ අක්ෂර නිරූපණය කරන ආකාරය ක්‍රියාව සමඟ පියවර වශයෙන් ලියන්න.

15.ත්‍රිතාලයේ සහ දීප්චන්දි තාලයේ සමාන අසමානතා ලියා දක්වන්න.

| | |
|---|---|
| විෂයය - පෙරදිග සංගීතය | ශ්‍රේණිය - 11 |
| පාඩම / ඒකකය - පහතරට හා සබරගමු වන්නම් | |
| ගුරුවරයාගේ නම - එස් . ඩී. දම්මි ප්‍රියංකා රාජපක්ෂ ( කලාප අධ්‍යාපන කාර්යාලය) | |

## කියවීම් පත්‍රිකාව

### පහතරට වන්නම්

- ❖ මෙම වන්නම් සින්දු වන්නම් ලෙස හඳුන්වයි.
- ❖ වන්නම් ගණනින් 32 කි.
- ❖ ආරම්භයේ සින්දු වන්නම් ගායනය සඳහා භාවිත වුවද පසු කාලීනව නර්තන අංගයක් ලෙස සකස් විය.



- ❖ ආරම්භය පිළිබඳ ජනප්‍රවාදයේ මත කිහිපයකි.
  - දඹදෙණි යුගයේ රජකළ කලිකාල සර්වඥ පණ්ඩිත දෙවන පරාක්‍රමබාහු රජු විසින් සින්දු වන්නම් රචනා කොට දෙවි නුවර උපුල්වන් දේවාලයට පුද පූජා පැවැත්වූ බව ,
  - බරණ ගණිතයාට වැළදුණු කුෂට රෝගයක් සුවපත් කර ගැනීම සඳහා ඔහු විසින් සින්දු වන්නම් රචනා කොට ගායනය කළ බව
  - අන්ධ පුද්ගලයෙකුට තම දෙනෙත් ලබා දෙන ලෙසට උපුල්වන් දෙවියන් ඉදිරියේ ගායනා කිරීමට බරණ ගණිතයා රචනා කර දුන් බව
- ❖ ගාල්ල , මාතර , අම්බලන්ගොඩ ආදී දකුණු පළාතට ආවේණිකව සකස් වී ඇත.
- ❖ බෙර පදය , තානම , කවිය , ඉරට්ටිය ලෙස වන්නමක කොටස් 04 කි.
- ❖ පහතරට බෙරය ප්‍රධාන අවනද්ධ භාණ්ඩයයි.
- ❖ මෙම සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය දෙවොල් මඩු ශාන්ති කර්මයයි.
- ❖ මෙම එක් එක් සින්දු වන්නම සඳහා තාලයක් හා වෘත්තයක් මුල් වන අතර සෑම සින්දු වන්නමක්ම දම්වැලක ඇමුණූ පුරුක් මෙන් අනු පිළිවෙලකට එකිනෙකට සම්බන්ධ වීම විශේෂත්වයකි . පළමු සින්දු වන්නම අවසාන කරන පදයෙන්දෙවෙනි සින්දුවන්නම ආරම්භ වේ.
- ❖ සින්දු වන්නම් හඳුන්වන්නේ මේ ආකාරයෙනි.
  - කොණ්ඩනාච්චි තාලය - ගහ කාරක වෘත්තය
  - විෂ්ණු තාලය - රාග වෘත්තය
  - නළු ගීතිකා තාලය - වෙට්ටික්පත්තු වෘත්තය

## නළු ගීතිකා තාලය

තානම

| ∧ | / | ∧ | / |
|---|---|---|---|
| තෙ   න   S | තෙ S න S | තෙ   න   S | තෙ S නෙ S |
| නා   S   S | S S තෙ S | න   ම්   S | තෙ S න S |
| S   S   S | තෙ S නෙ S | නා   S   S | S S S S |
| S   S   S | S S S S | S   S   S | S S S S |

කවිය - සේවිත පාද සරෝරුහ සන්ජිත යෙන්ඉතා
පූජිත තෝස දිගාසිරි දී මෙන් සන්තතා
වාරික නාථ ග්‍රහතෙයි සිරුසත විතතතා
පූජිත විෂ්ණු සුරාදීප රූප අලංකෘතා





දෙවොල් මඩු ශාන්ති කර්මය



**සබරගමු වන්නම්**

- ❖ රත්නපුර , කලවාන , පැල්මඩුල්ල , නිවිතිගල , කුරුවිට , ආදි සබරගමු පලාතට ආවේණිකව ප්‍රචලිත වී ඇත.
- ❖ දෙවියන් හා සතුන් පිළිබඳ වර්ණනා ඇතුළත්ය.
- ❖ විනෝදාස්වාදය පිණිස නිර්මාණය වී ඇති අතර ස්වර පරාසය පටුය.
- ❖ කලවානේ ධර්මාලංකාර අතපත්තු මුදලි විසින් සංස්කරණය කොට ඇති බව පැවසේ.
- ❖ නාමිකව වන්නම් 24 ක් වුවද භාවිතයේ පවතින්නේ වන්නම් 18 කි.
- ❖ උරගා , මයුරා , තිසරා , කෝකිල , ආනන්ද , අනිලා , මණ්ඩුක , ආදී වශයෙනි.
- ❖ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය දවුලයි.
- ❖ බෙර පදය , තානම , කවිය , කලාසම ,අඩව්ව , ලෙස වන්නම කොටස් 5 කි.
- ❖ සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය ගම්මඩු ශාන්ති කර්මයයි.





කෝකිල වන්නම ( මැදුම් තනි තිත හා දෙසුළු මැදුම් තුන්තිත යන තිත් රූප දෙකකින් යුතුය.)

තානම :- තාන තනා තන තනෙනා - තෙතන තනා තන තනෙනා
තාන තනා තම්දෙනා තානෙන තම් - තෙතන තනා තම්දෙනා

කවිය :- කොහෝ යනා හඬ නගනා - මියුරු වනා දන සවනා
පරපුටු වෙසෙසින්නේ වසන්නේ - මහවන ගස් මුදුනේ

රිටු විමනා බිජු ලමිනා - බහු නදනා රකෙනා මෙනා
ලොකු වී නද දෙන්නේ - ඔවුන්ගේ එම්විට බැටකන්නේ

රුව සමනා උවත් මනා - ඉසි වඩනා රිටු නොමිනා
රිටු පරපුටු හටනේ - දෙවන්නේ නිදසුන් යස නුවනේ

ලොව දූර්ජනා ගතිය මනා - මෙම හටනා ලොව තිබෙනා
අසනුය වියතුන්නේ - ගයන්නේ මේ මනහර වරුණේ




පහන් මඩු ශාන්ති කර්මය

නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න

1) පහතරට වන්නම් ගණනින් ....................................... කි.
2) ................................ සබරගමු සම්ප්‍රදාය සඳහා යොදා ගන්නා ප්‍රධාන අවනද්ධ භාණ්ඩයයි .
3) උඩරට මෙන්ම සබරගමු නර්තන සම්ප්‍රදායේ ද භාවිතයේ පවතින වන්නම් ගණන ............. කි.
4) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය ....................................... යි.
5) මුල් කාලයේ ගායනය සඳහා පමණක් භාවිත වූ නර්තන සම්ප්‍රදාය .................................. වේ.

නිවැරදි පිළිතුර තෝරන්න

6) .පහතරට නර්තන සම්ප්‍රදායේ ඇති විශේෂත්වයක් වන්නේ
 1. දේශීය තිත් රූප මත නිර්මාණය වීම 11. තාලයක් හා වෘත්තයක් මුල් වීම.
 111. ඉරට්ටිය නම් කොටසක් තිබීම 1V. විනෝදාස්වාදය මත නිර්මාණය වී තිබීම.
7) සබරගමු වන්නමක් නොවන්නේ
 1. තුරඟා 11. අනිලා 111. උරගා 1V. මණ්ඩුක
8) කලිකාල සර්වඥ පණ්ඩිත යන නම්බු නාමය හිමි වූයේ
 1. 1 වන විජයබාහු රජුට 11. 11 වන විජයබාහු රජුට
 111. 11 වන පරාක්‍රමබාහු රජුට 1V. 1V වන පරාක්‍රමබාහු රජුට
9) සබරගමු වන්නමකට අයත් නොවන කොටසකි.
 1. තානම 11. කවිය 111. කලාසම 1V. ඉරට්ටිය
10) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය ලෙස සැලකෙන්නේ
 1. කොහොඹා කංකාරිය 11. සූනියම් යාගය
 111. ගම්මඩු ශාන්ති කර්මය 1V. දෙවොල්මඩු ශාන්ති කර්මය

පිළිතුරු සපයන්න

11) " වන්නම් " යන්න කෙටියෙන් හඳුන්වා පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ තුන බැගින් ලියන්න.
12) පහතරට නර්තන සම්ප්‍රදායේ විශේෂත්වය කෙටියෙන් පැහැදිලි කරන්න
13) පහතරට හා සබරගමු වන්නම් රචකයින් කවුද ?
14) මෙම සම්ප්‍රදායන් දෙකම සඳහා නිදසුන් ( වන්නම් නාම ) තුන බැගින් ලියන්න.
15) පහතරට සහ සබරගමු වන්නම් වල කොටස් කීයද ? ඒ .මොනවාද ?

| | | |
|---|---|---|
| විෂය | :- පෙරදිග සංගීතය | ශ්‍රේණිය :- 11 |
| පාඩම/ ඒකකය | :- ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ වාදනය | |
| ගුරුවරයාගේ නම | :- එච්. හිරාන් ලෝචන කුරේ | පාසල :- අම්/ රජගම විද්‍යාලය |

❖ සුදු සහ කළු වර්ණයන්ගෙන් යුත් යතුරු පුවරුවක් නැතහොත් ස්වර පුවරුවක් යොදා ඇති සංගීත භාණ්ඩ Keyboard Instrument (ස්වර පුවරු සංගීත භාණ්ඩ) ගණයට අයත් වේ.

**නිදසුන් :-**



සර්පිනාව



මෙලෝඩිකාව



එකෝඩියනය



පියානෝව



විදුලි ඕගනය

❖ ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමේ දී නාද මාලාවට අදාළ ස්වර දකුණු අතින් වාදනය කරනු ඇත.

❖ මෙහි දී දකුණතේ අතැඟිලි පහ පහත ආකාරයට වාදනයේ දී අංකනය කෙරේ.




❖ ඉහත දක්වා ඇති දකුණු අතේ අංක මගින් ස්වර සප්තකය වාදනය කිරීමේ දී අතැඟිලි පහ යොදා ගන්නේ මෙසේ ය.



❖ මෙම කරුණු අවධාරණයට ගෙන දකුණු අතින් වාදනය පුහුණු වීම සඳහා පහත ස්වර අභ්‍යාසය සහ ස්වර ස්ථාපන ගීතය වාදනය කරමු.

<u>ස්වර අභ්‍යාසය</u>

| | | | |
|---|---|---|---|
| ආරෝහණ :- | ස රි ග | අවරෝහණ :- | ස̇ නි ධ |
| | රි ග ම | | නි ධ ප |
| | ග ම ප | | ධ ප ම |
| | ම ප ධ | | ප ම ග |
| | ප ධ නි | | ම ග රි |
| | ධ නි ස̇ | | ග රි ස |

<u>ස්වර ස්ථාපන ගීතය</u>

| | | | |
|---|---|---|---|
| ස ස ග ග | රි රි ග - | ස ස රි රි | ග - - - |
| ක ඳු පෙ ළ | අ ත රේ S | තු රු ව දු | ලේ S S S |
| ස - රි - | ග - ම - | ග - රි - | ස - - - |
| ග ං ගා S | වේ S හා S | වෙ ල් යා S | යේ S S S |
| ප - ප - | ම - ප ම | ග - ම ග | රි - - - |
| ගී S නා S | දේ S ගැ මි | යා S ම ව | නා S S S |
| ස රි ග ම | ප - - - | ප ම ග රි | ස - - - |
| සු ම දු ර | වේ S S S | ම න හ ර | වේ S S S |

❖ ස්වර පුවරුව වාදනය කිරීමේ දී දකුණු අත සේම වම් අත ද උපයෝගී කර ගනු ඇත.

❖ බටහිර සංගීතාංගයක් වන Chord සමඟ ගීතයක් වාදනයේ දී Chord වාදනය කරනු ලබන්නේ වම් අතිනි.

❖ ස්වර 3 ක් හෝ 4 ක් හෝ එකවර වැයීමෙන් Chord සෑදේ.

❖ Major හා Minor ලෙස ප්‍රධාන වශයෙන් Chord දෙකොටසකි.

❖ මීට අමතරව Chord වර්ග ද ඇත.

❖ ප්‍රධාන වශයෙන් C Major Scale එකට අයත් මූලික Chord වන C, F, G Major Chords වාදනය කරමු.

❖ පහත දැක්වෙන්නේ වමතින් වාදනය කරන ආකාරය වේ.










❖ ඉහත දක්වා ඇත්තේ මූලික වශයෙන් C, F, G Major Chords වාදනය කළ යුතු ආකාරය වේ.

❖ ගීත සමඟ Chords මාරු කරමින් වාදනය කිරීමේ දී පහසු ක්‍රම භාවිත කරනු ඇත.

❖ එලෙස වැයීමේ දී Chord එකට හිමි ස්වරයන් හි පිළිවෙල වෙනස්ව පිහිටයි.

❖ පහත වගුව ඇසුරෙන් එය අධ්‍යනය කරන්න.

❖ එහි ඇඟිලි දක්වා ඇත්තේ වමතේ ඇඟිලි භාවිත වන ආකාරයයි.




❖ මෙහි දී වමතේ ඇඟිලි අංකනය කර ඒවා හසුරුවා ගන්නා ආකාරය නිවරදිව අවබෝධ කර ගත හැකි ය.

| Chord | අදාළ ස්වර | | වමතින් වැයීමේ දී ස්වර පිහිටන පිළිවෙල හා අදාළ ඇඟිල්ල |
|---|---|---|---|
| C Major | ස ග ප | C E G | ප ස ග<br>5 2 1 |
| F Major | ම ධ ස | F A C | ධ ස ම<br>4 2 1 |
| G Major | ප නි රි | G D B | ප නි රි<br>5 3 1 |

❖ මෙම Chord වමතින් වාදනය කිරීමේ දී දකුණතින් ගීතයට අයත් ස්වර වාදනය කරනු ලැබේ.

❖ මෙහි දී Electronic Keyboard යන වාද්‍ය භාණ්ඩය යොදා ගත හැකි ය.

❖ පහතින් දැක්වෙන්නේ සරල ගීතයක ස්වර ප්‍රස්තාරයකි.

❖ මෙහි ස්වර වලට ඉහළින් දක්වා ඇත්තේ එම ස්වර ඛණ්ඩයට අයත් Chord එක වේ. මෙය වාදනය කරමින් අධ්‍යනයේ යෙදීම විශේෂ වේ.

## - නිල් අහස් තලේ අගේ -

| | | | |
|---|---|---|---|
| C | | F | G |
| ග - ම | ප - ග | ම - ග | රි - - |
| C | | G | |
| ග - ම | ප - ධ | නි - - | - - - |
| F | | C | G |
| ධ - නි | ස - ධ | ප - මග | රි - - |
| C | C | | |
| ප - රි | ග - රි | ස - - | - - - |

## ක්‍රියාකාරකම

01) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් වන්නේ,

(i) බටනලාව (ii) වයලීනය (iii) ගිටාරය (iv) එකෝඩියනය

02) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් නොවන්නේ,

(i) සර්පිනාව (ii) බටනලාව (iii) මෙලෝඩිකාව (iv) එකෝඩියනය

03) ප්‍රධාන වශයෙන් Chords වර්ග කීය ද?

(i) 1 කි (ii) 2 කි (iii) 3 කි (iv) 4 කි

04) C Major Scale එකට අයත් මූලික Chord තුන වන්නේ,

(i) C, E, G (ii) C, F, G (iii) C, D, F (iv) G, F, B

05) Chord සමඟ ගීතය ද වාදනය කිරීමට සුදුසු වාද්‍ය භාණ්ඩයක් වන්නේ,

(i) වයලීනය (ii) බටනලාව (iii) සිතාරය (iv) විද්‍යුත් ස්වර පුවරුව

06) C Major Chord එකට අයත් ස්වර වන්නේ,

(i) C, F, G (ii) F, A, C (iii) D, F, E (iv) G, B, D

07) /ප ප ග /ම ම රි / ග ග ස / රි - -/ මෙම ස්වර ඛණ්ඩයට වඩාත් සුදුසු Chord වන්නේ,

(i) /C/C/D/F/ (ii) /C/C/D/G/

(iii) /C/C/C/G/ (iv) /F/F/C/A/

08) Chord වමතින් වාදනය කිරීමේ දී C Major Chord එකට අදාල අංක පිළිවෙලින්,

(i) 1, 4, 5 (ii) 2, 4, 6 (iii) 1, 2, 3 (iv) 1, 3, 5

09) C Major Chord එකට අයත් ස්වර පිළිවෙලින්,

(i) ස, ග, ප (ii) ම, ධ, ස (iii) ප, නි, රි (iv) රි, ම, ධ

10) ස්වර 3 ක් හෝ 4 ක් එකවර වැයීමෙන් .................... සෑදේ. හිස්තැන සුදුසු පිළිතුර වන්නේ,

(i) Bits (ii) Chords

(iii) Scale (iv) Harmony

11) ස්වර සප්තකයක රූප සටහනක් ඇඳ C Major Scale නම් කරන්න.

12) C Major Scale එකට අයත් මූලික Chord තුන නම් කරන්න.

13) එම Chord තුනට අයත් ස්වර වෙන වෙනම ලියන්න.

14) ඔබ කැමති ගීයක ස්වර ප්‍රස්තාරය Chord සමඟ ලියන්න.

15) එම ගීතය ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් වාදනය කරන්න.

| | |
|---|---|
| විෂය :- පෙරදිග සංගීතය | ශ්‍රේණිය :- 11 ශ්‍රේණිය |
| පාඩම/ඒකකය :- රාගාශ්‍රිත සරල ගී | |
| ගුරුවරයාගේ නම :- එන්. කේ. ඩී. සුභද්‍රා කුමාරි | පාසල :- අම්/රජගලතැන්න මහා විද්‍යාලය |

රාගාශ්‍රිත සරල ගී යනු,

යම් රාගයක හෝ රාග කිහිපයක රාග සංගති සහ රාගධාරි ශිල්ප ක්‍රම ඇසුරු කර ගනිමින් නිර්මිත ගීත රාගාශ්‍රිත සරල ගී නම් වේ. එවැනි ගීතයක් ගැයීමට ශාස්ත්‍රීය පුහුණුවක් තිබීම ඉතාම වැදගත් වේ.

රාගාශ්‍රිත සරල ගී සඳහා යොදා ගන්නා රාගධාරි ශිල්ප ක්‍රම,

ආලාප, තානාලංකාර, අවනද්ධ පද, තිහායි, චක්‍රධාර්, මීන්ඩ්, ගමක්, මූර්කි ආදී ශිල්ප ක්‍රම වේ.

රාගාශ්‍රිත සරල ගී හා සාමාන්‍ය ගී අතර වෙනස,

| රාගාශ්‍රිත සරල ගී | සාමාන්‍ය ගී |
|---|---|
| රාගාශ්‍රිත සරල ගී සඳහා සංකීර්ණ ගායන ක්‍රම යොදාගෙන ඇත. | ගායනය සංකීර්ණ නොවේ. |
| ශාස්ත්‍රීය පුහුණුවක් තිබිය යුතුය. | පහසුවෙන් ගායනා කල හැක. |
| ශාස්ත්‍රීය සංගීත භාණ්ඩ යොදා ගනී. | සාමාන්‍ය සංගීත භාණ්ඩ යොදා ගනියි. |
| ගීත ආකෘතිය වෙනස්වේ. | ආරම්භක වාදන, ස්ථායි, අතුරුවාදන, අන්තරා ආකෘතියි |
| ශාස්ත්‍රීය ශෛලීන් අනුව නිර්මාණය වී ඇත. | සරල නාද රටා අනුව නිර්මාණය වී ඇත. |

රාගාශ්‍රිත සරල ගී සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ.



සර්පිනා



වයලීන්



සිතාර්



තබ්ලා



බටනලා

නිර්දේශිත රාගාශ්‍රිත සරල ගීත,

| රාගය | රාගාශ්‍රිත සරල ගීත | ගායනය |
|---|---|---|
| බිලාවල් | ලලිත කලා | චිත්‍රා සෝමපාල මිය |
| | ආදරේ කියූ කිසිවෙකු | ප්‍රියා සූරියසේන මහතා |
| | අඩවන් වූ දෙනෙතින් ගලනා | ඩබ්.ඩී. අමරදේව මහතා |
| භූපාලි | ගුමු ගුමුව වදුලේ | සමිතා මුදුන්කොටුව මිය |
| | මධුර යාමේ | ආර්. මුත්තුසාමි මහතා සමග සුජාතා අත්තනායක මිය |
| | මන්නාරම් පිටිවැල්ලේ | ෆ්‍රෙඩී සිල්වා මහතා |
| | සටනකි ජීවිතේ | ධර්මදාස වල්පොල මහතා |
| කාෆි | සරුංගලේ වරල් සැලේ | නන්දා මාලනී මිය |
| | බඹරෙකු ආවයි | ඩබ්.ඩී. අමරදේව මහතා |
| | සුවදේ මට සීතල සුළඟ පවා | මොහිදීන් බෙග් මහතා |
| භෛරවී | කවුරුදෝ අර කවුළුවෙන් | සනත් නන්දසිරි මහතා/ ශාන්ති ගීතදේව මහතා |
| | පාරමිතා බල | ඩබ්.ඩී. අමරදේව මහතා ඇතුලු පිරිස |
| | එන්න මද නලේ | තිලකසිරි ප්‍රනාන්දු |
| | සුපිපුණු සුගන්ධයින් | සුනිල් එදිරිසිංහ මහතා |
| | කලිඳු ගංහා දෙනියේ | චන්ද්‍රලේකා පෙරේරා මිය |
| | පුංචි දගකාරියේ | සේනානායක වේරලියද්ද |
| යමන් | ස්වර්ණ ප්‍රදීපාය මාන | ස්වර්ණලතා කවීශ්වර මිය |
| | සාදු දන්ත දා | සුජාතා අත්තනායක මිය |
| | හදේ කොතනක හෝ හිඳිවී | සුනිල් එදිරිසිංහ මහතා |
| | හෙට දවසේ | ප්‍රියා සූරියසේන මහතා |
| | අදුර අදුර මගේ | ප්‍රියා සූරියසේන මහතා |

රාගාශ්‍රිත සරල ගීත සඳහා උදාහරණයක්,

යමන් රාගය ආශ්‍රිත සරල ගීතයක්

හදේ කොතැනක හෝ හිඳී ඔබ
නිදා නොනිදා මෙන්
බලා අවසර සොයා කල් දැන
වෙළා හස රැහැනින් පෙළයි මා
මුදා සුව දැහැනින්

සයුර ඉම රත් සිතිජ රේඛාවේ
මියෙන හිරු සේ ගිලී බිම් අඳුරේ
තළා මා සිත පලා ගිය ඔබ
දවයි මා අද තනි වෙනා මොහොතේ

හදේ කොතැනක හෝ

උතුම් පිවිතුරු ප්‍රේමයේ නාමෙන්
සහස් සුවහස් පැතුම් බල මහිමෙන්
ඉනු කඳුළ ද සිඳෙන්නට පෙර
යදින්නම් ඔබ මැකීයනු මතකෙන්

හදේ කොතැනක හෝ

ගේය පද - කුමාරදාස සපුතන්ත්‍රී
තනුව - සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - සුනිල් එදිරිසිංහ

භෛරවී රාගය ආශ්‍රිත සරල ගීතයක්

කවුරුදෝ අර කවුළුවෙන් හිනාවී එබිකම් කළේ
ඒ හිනාවෙන් මා වෙළන්න ද මා වෙළාගෙන මට තළන්නද
ඇ හිනා වෙන්නේ

ඉතින් මට බැහැ ඇත යන්නට
ඒ නුවන් රැහැනින් මිදීලා
කවුළුවේ දොර හදෙන් ඇරගෙන
නෙත් ළඟින් ඉන්නම්

කවුරුදෝ අර කවුළුවෙන්........

කතා නොකරන තාරකාවක්
පාර කීවත් මම නොයන්නෙමි
කවුළුවේ දොර හදෙන් හැරගෙන
නෙත් ළඟින් ඉන්නම්

ගායනය - ශාන්ති ගීතදේව/සනත් නන්දසිරි
තනුව/සංගීතය - ශාන්ති ගීතදේව

කාර්යය පත්‍රිකාව:-

අංක 1 – 3 තෙක් ඇති ප්‍රකාශ වැරදිය. ඒවා නිවැරදි කර ලියන්න.

1. බිලාවල් රාගයේ ස්වර සංගති ඇසුරු කරමින් නිර්මාණය වූ නූර්ති ගීතයක් ලෙස 'පාරමිතා බල' ගීතය හැඳින්විය හැකිය.
2. යමන් රාගය ආශ්‍රිතව නිර්මාණය වූ 'සරුංගලේ වරල් සැලේ' ගීතය නන්දා මාලනීයන් විසින් ගයනු ලබයි.
3. ආලාප, තානාලංකාර, අවනද්ධ පද ආදී රාගධාරී ශිල්ප ක්‍රම සරල සංගීතයට අත්‍යවශ්‍යය අංගයන් වේ.

අංක 4 – 10 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

4. එන්න මද නලේ ගීතය .................................. රාග ආශ්‍රිත සරල ගීතයකි.
5. පන්ඩිත් ඩබ්.ඩී. අමරදේව මහතා ගායනා කල .................................. ගීතය සර්ව කෝමළ රාගයක් වූ .................................. රාගය ආශ්‍රිත සරල ගීතයකි.
6. රාගාශ්‍රිත සරල ගීත සඳහා .................................. ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගනී.
7. .................................. රාගය ආශ්‍රිතව නිර්මාණය වූ .................................. ගීතය මගින් මහමෙව්නා උයනේ සමාධි පිළිම වහන්සේ ගැන කියවේ.
8. වාදී. සංවාදී ස්වර පිළිවෙලින් ග, ධ යෙදෙන .................................. රාගය ආශ්‍රිතව නිර්මාණය වූ .................................. ගීතය තුලින් දමිල සංස්කෘතිය පිළිබඳ චිත්‍ර රූප මවයි.
9. ප්‍රියා සූරියසේන මහතා ගායනයෙන් දායක වූ .................................. ගීතය .................................. මේලගත යමන් රාගයේ ස්වර සංගති ඇසුරු කර ගනිමින් නිර්මාණය වී ඇත.
10. සුනිල් එදිරිසිංහ මහතා ගායනා කරන .................................. ගීතය රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන .................................. රාගයේ ස්වර සංගති ඇසුරු කර ගනිමින් නිර්මාණය වී ඇත.

අංක 11– 15 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

11. රාගාශ්‍රිතව නිර්මාණය වී ඇති සිංහල සරල ශාස්ත්‍රීය ගීතයක් පිළිබඳ රස වින්දනාත්මක විමසුමක් කරන්න.
12. රාධගාරී සංගීතය ඇසුරෙන් නිර්මාණය කළ සරල ගී බොහොමයක් ශ්‍රී ලාංකේය ජන සමාජය තුල ජනප්‍රියව පවතී. ඒ කියමන සනාථ කිරීම සඳහා ජනප්‍රිය රාගාශ්‍රිත සරල ගී ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
13. සාමාන්‍ය සරල ගීයක හා රාගාශ්‍රිත සරල ගීයක වෙනස සංසන්දනය කරන්න.
14. රාගාශ්‍රිත සරල ගී සඳහා යොදා ගන්නා රාගධාරී ශිල්ප ක්‍රම නම් කරන්න.
15. රාගාශ්‍රිත සරල ගී සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩ හඳුනාගෙන නම් කරන්න.

| | |
|---|---|
| විෂය :- පෙරදිග සංගීතය | ශ්‍රේණිය :- 11 ශ්‍රේණිය |
| පාඩම/ඒකකය :- නව නාට්‍ය ගීත | |
| ගුරුවරයාගේ නම :- එන්. කේ. ඩී. සුභද්‍රා කුමාරි | පාසල :- අම්/රජගලතැන්න මහා විද්‍යාලය |

නව නාට්‍ය ගීතවල ආරම්භය සිදු වූයේ 1956 වර්ෂයේ එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයෙනි. ඓතිහාසික පුරාවෘත්ත, ආගමික තොරතුරු එදිනෙදා සිද්ධි නාට්‍ය අනුසාරයෙන් නව නාට්‍ය වලින් නිර්මිතය.



එදිරිවීර සරච්චන්ද්‍රයන්



මනමේ නාට්‍යයේ දර්ශනයක්

නව නාට්‍යයවලදී සංගීතයට ප්‍රධාන තැනක් හිමිවේ. සංගීතය නව නාට්‍ය සඳහා අත්‍යවශ්‍යය. එනම් නාට්‍යයක අවස්ථා හා ඊට උචිත පරිසරය මැවීම සඳහා නාට්‍ය අවස්ථා තීව්‍ර කිරීම සඳහා සංගීතය යොදා ගනී. මෙහි නළු නිළියන්ට ගීත ගැයීමේ හැකියාව අත්‍යවශ්‍යය.

නූතන නව නාට්‍ය ගීත බොහෝදුරට පැරණි නාට්‍ය ගීතවලට වඩා නාට්‍යෝචිත ස්වභාවයෙන් ඉවත්ව සරල ස්වභාවයක් ගනියි. ඇතැම් නව නාට්‍යය තනුවල තවමත් සාම්ප්‍රදායික නාඩගම් ඡායාවක් තිබේ.මෙහිදී ගායනය සමඟම රංගනය ද සිදු කරයි. ගීත අලංකරණය කිරීම සඳහා සංගීතය මඟින් introduction, bits භාවිතා කරයි.

## නව නාට්‍යය ප්‍රභේද:-

ශෛලීගත හා අර්ධ ශෛලිගත ලෙස නව නාට්‍ය ප්‍රභේද දෙකකි.

- මනමේ, සිංහබාහු හා හුණුවටයේ කතාව ශෛලිගත නාට්‍යවලට උදාහරණ ලෙස දැක්විය හැකිය.
- අර්ධ ශෛලිගත නාට්‍ය ලෙස නරිබැනා, බෙරහඬ හා මී පුර වැසියෝ නම් කළ හැකිය.



හුණුවටයේ කතාව - ශෛලිගත නාට්‍යයකි



බෙරහඬ - අර්ධ ශෛලිගත නාට්‍යයකි

- ශෛලිගත නාට්‍යවලට අත්වැල් ගායක කණ්ඩායමක් සිටීම විශේෂ ලක්ෂණයකි.
- අර්ධ ශෛලිගත නාට්‍යවල ගීත එම චරිත විසින්ම ගායනා කරයි.

පහත සඳහන් වන්නේ නිර්දේශිත නව නාට්‍ය කිහිපයක් පිළිබඳ තොරතුරු වේ.

| නව නාට්‍ය | නිර්මාණ දායකත්වය | අයත් ගීත | සංගීතය |
|---|---|---|---|
| අන්දරේලා | ජයලත් මනෝරත්න මහතා | රස බොජුනක් නැතත් | රෝහණ බැද්දගේ මහතා |
| කුස පබාවති | විජය නන්දසිරි මහතා | රතදර සිරි පරදන | එඩ්වඩ් ජයකොඩි මහතා |
| තාරාවෝ ඉගිලෙති | ලූෂන් බුලත්සිංහල මහතා | සෝබාව දේ | ගුණදාස කපුගේ මහතා |
| රතු හැට්ටකාරි | ලූෂන් බුලත්සිංහල මහතා | යස ඉසුරු | ඔස්ටින් මුණසිංහ මහතා |
| තවු | ජයසේකර අපොන්සු මහතා | අපි කිරිල්ලියො | එච් ආර් චූලසිංහ මහතා |
| මධුර ජවනිකා | දයානන්ද ගුණවර්ධන මහතා | නෙයිනා ගේ සුදුව (පළමුව මම) | රෝහණ බැද්දගේ මහතා |
| අබුද්දස්ස කෝලම | ජනක් ප්‍රේමලාල් මහතා | අපේ මුණි සඳ | සරත් කුලාංග මහතා |
| රාජ කපුරු | ජනක් ප්‍රේමලාල් මහතා | සුවඳ සබන් ඇඟ ගාලා | සරත් කුලාංග මහතා |

භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ නාට්‍ය ප්‍රභේද






නව නාට්‍ය නිර්මාණකරුවන්,


ජයලත් මනෝරත්න


ලූෂන් බුලත්සිංහල


ජනක් ප්‍රේමලාල්


ජයසේකර අපොන්සු

තාරාවෝ ඉගිලෙති නාට්‍යයේ ගීතයක්

සෝබාව දේ මෙපුර සිරි විසිතුරු බලනු මිතුරු මග පියකරු වූ
සුසුදු වලා කැරලි පලසකි මේ මහ දිග ඇතිරූ
අහස සූරන මැදුරු

පාර දෙපැත්තේ සොඳුරු සල්පිල්වල දෙව්ලොව නැති සැප විකුණන්නේ
නුවරු රිසි රිසි දේ ගෙන මසුරන් තඹයට දෙන්නේ
නිබඳ සිත ළතැවෙන්නේ

සැණකෙලි පුරා හදේ නිකිණි අවන්හල් පිබිදෙන්නා
ඇසූවන් දුක් පිනවන ගී සින්දු සවන පිනන්නා
සතහට සෙත සලසා අතකින් මධුවිත පුරවන්නේ
සව්දිය පුරන ළඳක් රකුසු නෙතක් පාළු කපන්නේ

නාටක දුහුල ඉරන් නාරිලතා මල් පූදින්නා

කාර්යය පත්‍රිකාව:-

**හිස්තැනට සුදුසු පිළිතුර යොදා ඡේදය සම්පූර්ණ කරන්න.**

ශ්‍රී ලංකාවේ නව නාට්‍ය සම්ප්‍රදාය (1)........................ වර්ෂයේ දී (2).................... මහතාගේ මනමේ නාට්‍යයෙන් ඇරඹිණි. එතැන් සිට නිර්මාණය වූ නාට්‍ය (3).................. හා අර්ධ ශෛලිගත වශයෙන් දෙයාකාර වේ. (4) .................... නාට්‍ය වලට අත්වැල් ගායක කණ්ඩායමක් සිටින අතර (5) ............................ නාට්‍යවල ගීත එම චරිත විසින්ම ගායනා කරයි.

**අංක 6-10 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

6. නව නාට්‍ය නිර්මාණකරුවකු නොවන්නේ,
   (i) ජනක් ප්‍රේමලාල් ශූරීන් (ii) ලූෂන් බුලත්සිංහල ශූරීන්
   (iii) විජය නන්දසිරි ශූරීන් (iv) ප්‍රේමකීර්ති ද අල්විස් ශූරීන්

7. 'සෝබාව දේ' ගීතය ඇතුළත් නාට්‍ය වන්නේ,
   (i) තාරාවෝ ඉගිලෙති (ii) අන්දරේලා
   (iii) තට්ටු (iv) කුස පබාවතී

8. 'අන්දරේලා' නාට්‍ය සඳහා සංගීත නිර්මාණයෙන් දායක වූයේ,
   (i) ගුණදාස කපුගේ මහතා (ii) රෝහණ බැද්දගේ මහතා
   (iii) ඔස්ටින් මුණසිංහ මහතා (iv) සරත් කුලාංග මහතා

9. විරිදුවක් අනුගමනය කරමින් ගයන ගීතය,
   (i) යස ඉසුරු (ii) සෝබාව දේ
   (iii) සුවඳ සබන් ඇඟ ගාලා (iv) පලමුව මම වැන්ද බුදුන්

10. 'රාජ කපුරු' නාට්‍යයේ එන ගීතයක් වන්නේ,
   (i) සුවඳ සබන් (ii) යස ඉසුරු
   (iii) අපි කිරිල්ලියො (iv) අපේ මුණි සඳ

**අංක 11-15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

11. අභිනය හා මුද්‍රා පමණක් උපයෝගී කරගනිමින් සංගීතය ප්‍රධාන කොට රඟ දක්වන නාට්‍ය විශේෂය කුමක්ද?
12. අර්ධ ශෛලීගත හා ශෛලිගත නාට්‍ය සඳහා උදාහරණ සපයන්න.
13. නව නාට්‍යවල සංගීතමය ලක්ෂණ උදාහරණ සපයමින් විස්තර කරන්න.
14. ඔබ උගත් නව නාට්‍ය ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර ගත කරන්න.
15. ඉහත වගුවේ ඇතුලත් නොවූ නව නාට්‍ය පහක් නම් කරන්න.

| | |
|---|---|
| විෂයය - පෙරදිග සංගීතය | ශ්‍රේණිය.- 11 ශ්‍රේණිය |
| පාඩම/ඒකකය. - බටහිර සම්භාව්‍ය සංගීතයේ සංගීතඥයන් සහ සංධ්වනි වල ස්වභාවයන් | |
| ගුරුවරයාගේ නම. - J A D චම්පික සරත් කුමාර | |
| පාසල- අම්/බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල අම්පාර | |



## වුල්ෆ් ගෑන්ග් අමදියෙස් මොසාර්ට්

- ක්‍රිස්තු වර්ෂ 1756 ජනවාරි 27 වන දින ඔස්ට් සැල්ස්බර්ග් නුවර උපත ලදී.
- වයස අවුරුදු 6 සිට සංගීත ප්‍රසංග පැවැත්විය
- අවුරුදු නවයේදී ප්‍රථම සිම්පනිය නිර්මාණය කළේය.
- වයස අවුරුදු දොළහේදී ප්‍රථම ඔපෙරාව නිර්මාණය කළේය
- ජුපිටර්,ද මැජික් ෆ්ලූට්,සිම්පනි නම්බර් 41,G minor symphony මොහු ගේ සංගීත නිර්මාණ අතර ප්‍රධාන වේ
- දක්ෂ බටහිර සම්භාව්‍ය සංගීතඥයෙකි
- 1791 දෙසැම්බර් පස් වැනිදා ඔස්ට්‍රියාවේ වියානා නුවර දී මිය ගොස් ඇත.



## ලුඩ්විග් වෑන් බීතෝවන්

- ක්‍රිස්තු වර්ෂ 1770 දෙසැම්බර් 17 ජර්මනියේ බොන් නුවර උපත ලැබීය
- බටහිර සම්භාව්‍ය සංගීතයේ ප්‍රවීණයෙකි.
- Fur Elise බීතෝවන් ගේ විශිෂ්ට සොනාටා නිර්මාණයකි.
- මොහුගේ සංගීත නිර්මාණ අතර එරොයිකා,පැස්ටරෝල්, ඉතා ජනප්‍රිය විය
- සිම්පනි නමයක්, පියානෝ කොන්සර්ටෝ පහක්, පියානෝ සොනාටා 32,ස්ට්‍රිං ක්වාටට් 16 නිර්මාණය කර ඇත
- ජීවිතය අවසාන කාලයේ ශ්‍රවණ ආබාධිත තත්වයට පත් විය
- 1827 මාර්තු 26 ඔස්ට්‍රියාවේ වියානා නුවර දී මිය ගොස් ඇත.

## යානි ( yanni chrysomallis )



- 1954 නොවැම්බර් මස 14 වන දින ග්‍රීසියේ කළමාටා ගම්මානයේදී උපත ලැබීය.
- ලොව වටා ගොස් සංගීත ප්‍රසංග ඉදිරිපත් කරන්නකි

- සංධ්වනි නිර්මාණකරුවෙකි ,වාදන ශිල්පියෙකි, සිනමා හා රූපවාහිනී වැඩසටහන්වලට තනු නිර්මාණය කරන්නෙකි.
- ජෑස්,පොප්, ක්ලැසිකල් යන සංගීත ක්‍රම වලින් පෝෂිත ව තමාට අනන්‍ය වූ ආරකට නිර්මාණකරණයේ නියැලේ.
- වර්තමාන ලෝකයේ සිටින අති දක්ෂ සංගීත කණ්ඩායම් මෙහෙයවන්නෙකි.
- ලොව රටවල් බොහොමයක වාදන ශිල්පීන් මොහුගේ සංගීත කණ්ඩායම් තුළ දැකිය හැක.
- 2014 වර්ෂයේ අප්‍රේල් මස ලංකාවට පැමිණ ප්‍රසංගයක් පවත්වා ඇත.

## ප්‍රශ්න

1. Fur Elise සොනාටාව නිර්මාණය කළේ
   (1) මොසාර්ට් (11) යානි. (111) බීතෝවන් (1V) මේ කිසිවකු නොවේ
2. මෝසාර්ට්ගේ සංගීත නිර්මාණයක් නොවන්නේ
   (1) G minor. (11) ජුපිටර්. (111) ද මැජික් ෆ්ලූට්. (1V) එරොයිකා
3. යානි උපත ලැබුවේ,
   (1) ග්‍රීසිය (11) ඔස්ට්‍රියාවේ ය (111) ජර්මනියේය. (1V) ඉතාලියේ ය
4. තම ජීවිතය අවසාන කාලයේ ශ්‍රවා ආබාධ සහිතව සංගීත නිර්මාණය කළ සංගීතඥයෙකි,
   (1 ) මොසාර්ට්. (11) බීතෝවන්. (111) යානි (1V) රවි ශංකර්
5. බටහිර සංගීතයට අදාල නිර්මාණයක් නොවන්නේ,
   (1) සොනාටා. (11) ඔපෙරා. (111) සංධ්වනි. (1V) කව්වාල

- නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

  ( බීතෝවන් ,එරොයිකා,යානි,මොසාර්ට්,32ක්,බොන් නුවර, ක්‍රිස්තු වර්ෂ 1770 දී )

6. සොනාටා.................. බීතෝවන් විසින් නිර්මාණය කළේය
7. .................... බීතෝවන් උපත ලැබීය.
8. පැස්ටරෝල් සහ ............... බීතෝවන්ගේ සිම්පනි වේ.
9. ජෑස්,පොප්, ක්ලැසිකල්, යන සංගීත ක්‍රමවලින්................ සංගීතඥයා නිර්මාණ කළේය.
10. 1971 වර්ෂයේ දෙසැම්බර් 5 වන දින වියානා නුවර දී............... මිය ගියේය.

- පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

11. ඔබ උගත් බටහිර සංගීතඥයන් තුන්දෙනෙක් නම් කරන්න
12. යානිගේ සංගීත කණ්ඩායම් තුල දැකිය හැකි විශේෂ ලක්ෂණ මොනවාද?
13. අමදියෙස් මොසාර්ට් ගේ සංගීත නිර්මාණ තුනක් ලියා දක්වන්න
14. symphony ඔකෙස්ට්‍රා සඳහා වර්තමානයේ ප්‍රචලිත සංගීතඥයකු නම් කරන්න
15. ඔබ උගත් බටහිර සංගීතඥයෙකු නම් කර ඔහුගෙන් සංගීතයට සිදුවූ සේවය කරුණු හතරකින් පැහැදිලි කර ලියා දක්වන්න.

| | |
|---|---|
| විෂයය :-පෙරදිග සංගීතය | ශ්‍රේණිය :- 11 |
| පාඩම / ඒකකය:- කෝඩ්ස් සංකල්පය | |
| ගුරුවරයාගේ නම :- ඩබ් . ඒ. කුමුදු නිශාන්ත | පාසල- අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය |

## Chords - කෝඩ්ස්

- Chords යනු බටහිර සංගීත සංකල්පයකි.ස්වර දෙකකට වැඩි සංඛ්‍යාවක් සුසංයෝග වීම, එකතුවීම හා එකවර යොදා ගැනීම කෝඩ්ස් ලෙස හැඳින්වේ.
- ස්වර 3ක කෝඩ්ස් tried ලෙස හඳුන්වයි.තවද ස්වර 2ක කෝඩ්ස් ද ස්වර 4ක කෝඩ්ස් ද ඇත.
- ගීතයක ප්‍රධාන නාදමාලාවට (Melody) ගැළපෙන ලෙස ගීතයේ තාලය මතුවන අයුරින් කෝඩ්ස් වාදනය කරයි.පියානෝවේ වම් අතින් කෝඩ්ස් ද දකුණු අතින් Melody කොටස ද වයයි.සාමාන්‍යයෙන් වාදක මණ්ඩලයකදී කෝඩ්ස් වයන්නේ ගිටාරයෙනි.නිර්මාණයට වැඩි අලංකාරයක්,රසයක් සහ මිහිරක් ඉන් එකතු වේ.
- Major , Minor (මේජර්,මයිනර්)ලෙස ප්‍රධාන කෝඩ්ස් වර්ග දෙකකි.ඊට අමතරව Diminish, Augmented, Seventh, Sustain, Added 6th, Added 9th යන කෝඩ්ස් වර්ගද භාවිතා වේ.
- ගීතයක් සඳහා කුමන කෝඩ්ස් යොදාගන්නේද යන්න තීරණය වන්නේ එම නිර්මාණය අයත් වන Scale එක අනුවය.
- බටහිර සංගීතයේදී මේජර් ස්කේලයක් සඳහා ප්‍රධාන කෝඩ්ස් 3ක්(Family chords) භාවිතවේ.එම කෝඩ්ස් 3 සකස් වන්නේ මේජර් ස්කේලයේ ශුද්ධ ස්වර මගිනි.
- ශුද්ධ ස්වර පමණක් ඇතුළත් කෝඩ්ස් 3ක් මේජර් ස්කේලයක ඇත.එම කෝඩ්ස් මේජර් ස්කේලයේ ප්‍රධාන කෝඩ්ස් 3යි. මේජර් ස්කේලයකින් සිදුකළ සංගීත නිර්මාණයකට මෙම ප්‍රධාන කෝඩ්ස් 3 සෑහේ.ඒ අනුව මේජර් ස්කේලය වෙනස් වන විට ප්‍රධාන කෝඩ්ස් 3 ද වෙනස් වේ.

| උදා:- ස්කේල් | කෝඩ්ස් |
|---|---|
| **C** Major scale | **C** Major **F** Major **G** Major |
| **D** Major scale | **D** Major **G** Major **A** Major |
| **E** Major scale | **E** Major **A** Major **B** Major |
| **F** Major scale | **F** Major **B** Flat Major **C** Major |

**ඕනෑම මේජර් ස්කේලයක ප්‍රධාන කෝඩ්ස් තුන (03) සොයාගන්නා ආකාරය**

C Major scale **C** D E **F** **G** A B - C F G
1 4 5

D Major scale **D** E F# **G** **A** B C# - D G A
1 4 5

ස්කේලයක ප්‍රධාන කෝඩ්ස් 03 Family chords ලෙසද හඳුන්වයි. C Major scale ස්කේලයට අයත් මෙම ගීතයට කෝඩ්ස් යෙදෙන අයුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| C | C | C | G |
| ග - ම | ප - ග | ම - ග | රි - - |
| C | C | G | G |
| ග - ම | ප - ධ | නි - - | - - - |

එම නාද මාලාවම D Major Scale ට අනුව ප්‍රස්ථාර කළ විට,

| | | | |
|---|---|---|---|
| D | D | D | A |
| ම/ - ප | ධ - ම/ | ප - ම/ | ග - - |
| D | D | A | A |
| ම/ - ප | ධ - නි | රි - - | - - - |

**පහත දැක්වෙන ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

01.කෝඩ්ස් යනු .................. සංගීත සංකල්පයකි.1.පෙරදිග 2.හින්දුස්ථානි 3.බටහිර 4.චීන

02.ස්වර දෙකකට වැඩි ප්‍රමාණයක ........වීමෙන් කෝඩ්ස් සෑදේ.

1.සංග්‍රාම 2.සංයෝග 3.සුසංයෝග 4.වියෝග

03.ස්වර තුනකින් සෑදෙන කෝඩ්ස් ............ නම් වේ.

1.Threate 2.Tired 3.Tyre 4.Tried

04.දකුණතින් මෙලඩි (නාද මාලාව) වමතින් කෝඩ්ස් වයන ස්වර පුවරු භාණ්ඩය වන්නේ,

1.ගිටාරය 2.වයලීනය 3.සෙලෝ 4.පියානෝ

05.සාමාන්‍යයෙන් වාදක මණ්ඩලයක කෝඩ්ස් වාදනය කරන භාණ්ඩය වන්නේ,

1.වයලින් 2.ට්‍රම්පට් 3.ගිටාර් 4.වියෝලා

**පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.**

06.ප්‍රධාන කෝඩ්ස් වර්ග දෙක ලියන්න.

07.ගීතයක ප්‍රධාන නාදමාලාව හඳුන්වන බටහිර සංගීත නාමය කුමක්ද?

08.ප්‍රධාන කෝඩ්ස් වර්ග දෙකට අමතරව වෙනත් කෝඩ්ස් වර්ග දෙකක නම් ලියන්න.

09.ගීතයක් සඳහා යොදාගන්නා කෝඩ්ස් මොනවාදැයි තීරණය වන්නේ කෙසේද?

10.C Major scaleයේ ප්‍රධාන කෝඩ්ස් 03 (Family chords)නම් කරන්න.

11.කෝඩ්ස් යනු කුමකුදැයි කෙටියෙන් හඳුන්වන්න.

12. C Major scale ට අයත් ස්වර පිළිවෙලින් ලියන්න.

13.D Major සහ E Major ස්කේලයන්ට අදාළ ප්‍රධාන කෝඩ්ස් 03 (Family chords)සොයාගන්නා ආකාරය අංක මගින් දක්වන්න.

14.නිල් අහස් තලේ ගීතයේ මුල් පේළි දෙක ස්වර ප්‍රස්තාර කොට (C Major scale ට අදාළව) කෝඩ්ස් නිවැරදිව යොදන්න.

15. ඔබ කැමති ගීතයක මුල් පේළි දෙක ස්වර ප්‍රස්තාර කොට ඊට අදාළව කෝඩ්ස් යොදන්න.



| | | |
|---|---|---|
| විෂයය :-පෙරදිග සංගීතය | | ශ්‍රේණිය :- 11 |
| පාඩම / ඒකකය :-Major කෝඩ්ස් ගොඩනැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ | | |
| ගුරුවරයාගේ නම :-ඩබ් . ඒ. කුමුදු නිශාන්ත | | පාසල- අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය |

## Major (මේජර්) කෝඩ්ස් ගොඩනැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ

- ✶ සප්තකයක ඇති සම්පූර්ණ ස්වර ගණන 12 කි.මේජර් කෝඩ්ස් සෑදීමේදී මෙම ස්වර 12 ආරෝහණ පිළිවෙලට ලියා ගැනීම අත්‍යවශ්‍ය වේ. ස රි රි ග ග ම ම/ ප ධ ධ නි නි මේජර් කෝඩ්ස් සහ මයිනර් කෝඩ්ස් යනුවෙන් ප්‍රධාන කෝඩ්ස් වර්ග දෙකක් භාවිතයේ පවතී.
- ✶ දැන් මේජර් කෝඩ් එකට අයත් නිවැරදි ස්වර තුන ලබා ගන්නා ආකාරය බලමු.

✶ **Major chords (1 5 8)**

- ✶ මේජර් කෝඩ් එකට අදාළ නම දරන ස්වරයේ සිට 5 වන ස්වරයත් 8 වන ස්වරයත් ඉතිරි ස්වර දෙක වේ.එනම් මේජර් කෝඩ් සඳහා 1 5 8 සංකල්පය වැදගත් වේ.
- ✶ මේජර් කෝඩ් එකට අයත් ස්වර 03 ලබා ගන්නා ආකාරය මෙසේය.
- ✶ ආරම්භක ස්වරයේ සිට ස්වර දොළහ පිළිවෙලින් ලියන්න.ආරම්භක ස්වරය 1 ලෙස ගෙන එතැන් සිට 5 වෙනි හා 8 වෙනි ස්වරය එක්ව ගත් විට මේජර් කෝඩ් එක සෑදේ.
- ✶ **C Major , F Major ,G Major යන කෝඩ්ස් ගොඩනැගෙන අයුරු**

C Major chord - ස රි රි ග ග ම ම/ ප ධ ධ නි නි
1 2 3 4 5 6 7 8 9 10 11 12
ස(C) ග(E) ප(G)

F Major chord - ම ම/ ප ධ ධ නි නි ස රි රි ග ග ම
1 5 8
ම(F) ධ(A) ස(C)

G Major chord - ප ධ ධ නි නි ස රි රි ග ග ම ම/ ප
1 5 8
ප(G) නි(B) රි(D)

- ✶ මෙලෙසම ස්වර 12 සෑම සවරයකින්ම ආරම්භ කොට මේජර් කෝඩ්ස් 12 ක් නිර්මාණය වේ.

**C Major , F Major ,G Major යන කෝඩ්ස් ආශ්‍රිත නිර්මාණ**

C Major ස්කේලයට අදාළව නිර්මාණයක් සිදුකිරීමේදී C F G කෝඩ්ස් තුන ප්‍රමාණවත් වන්නේ එම ස්කේලයේ ස්වර C F G කෝඩ්ස් වලට අදාළ ස්වර නියෝජනය කරන බැවිනි.

C - ස ග ප
F - ම ධ ස } ස රි ග ම ප ධ නි
G - ප නි රි

ඒ අනුව C Major ස්කේලයට අයත් නිර්මාණයකට කෝඩ්ස් යොදන ආකාරය මෙසේය.

| | | | |
|---|---|---|---|
| C | C | F | G |
| ග - ම | ප - ග | ම - ග | රි - - |
| C | C | G | G |
| ග - ම | ප - ධ | නි - - | - - - |
| F | F | C | G |
| ධ - නි | ස - ධ | ප - මග | රි - - |
| G | G | C | C |
| ප - රි | ග - රි | ස - - | - - - |

පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

01.සප්තකයක ඇති සම්පූර්ණ ස්වර ගණන වන්නේ,

1. 7 2. 8 3.12 4. 10

02.කෝඩ්ස් නිර්මාණය කිරීමට ප්‍රථම අනිවාර්යයෙන් කළ යුත්තේ,

1.ස්වර සප්තකය ලිවීම. 2.ස්වර 12 පිළිවෙලින් ලිවීම.
3.ආරෝහණ අවරෝහණ ලිවීම. 4.ස්වර අෂ්ටකය ලිවීම.

03.ප්‍රධාන කෝඩ්ස් වර්ග දෙක වන්නේ,

1.Minor, major 7 th 2.sustain,minor 3.Major, minor 4.Major , Diminish

04.මේජර් කෝඩ්ස් ලබා ගන්නා සම්මත අංක පිළිවෙල වන්නේ,

1. 1 2 3 2. 1 5 8 3. 1 4 8 4. 1 4 5

05. C Major chord එකට අදාළ ස්වර පිළිවෙල වන්නේ,

1. C E G 2. C G E 3. C F G 4. C G F

06. F Major chord එකට අදාළ ස්වර පිළිවෙල වන්නේ,

1. F A C 2. F A B 3. F B A 4. A C F

07.G Major chord එකට අදාළ ස්වර පිළිවෙල වන්නේ,

1. G F E 2. G F A 3. G D F 4.G B D

08. ස්වර 12 පිළිවෙලින් ලියූ විට ස රි රි ග ග ම ම/ ප - - - - ඉතිරි ස්වර 4 වන්නේ,

1. ප ධ නි නි 2. ප ප ධ නි 3. ධ ධ නි නි 4. ධ ධ නි නි

09.ස - -/ම - -/ම - ධ/ප - රි යන ස්වර ඛණ්ඩයට අදාළ නිවැරදි කෝඩ්ස් පිළිවෙල වන්නේ,

1.C / C / F / C 2. C / F / F / G 3.F / G / C / C 4.G / G / C / F

10.කෝඩ්ස් වාදනය සඳහා යොදා ගන්නා තත් භාණ්ඩය වන්නේ,

1.බේස් ගිටාරය 2.ලීඩ් ගිටාරය 3.රිදම් ගිටාරය 4.එකෝඩියන්

11.සප්තකයක පිහිටන ස්වර 12 නිවැරදිව පිළිවෙලින් ලියන්න.

12.ස්වර 12 උපයෝගී කොටගෙන C Major chord එක සාදන ආකාරය ලියන්න.

13.මේජර් කෝඩ්ස් ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| Chord නාමය | නියමිත ස්වර | අපරදිග ස්වර සංකේත |
|---|---|---|
| C Major | | C E G |
| F Major | | |
| G Major | | |
| E Major | ග ධ නි | |

14. ස ස ග ග/ප - ප -/ප - නි -/ධ - - -
රි ග ම ප/ධ - ධ -/ස - ග -/ස - - - මෙම ස්වර ප්‍රස්ථාරයට ගැළපෙන කෝඩ්ස් ඒ ඒ විභාගය තුළ ලියන්න.

15.මෙම කෝඩ්ස් සටහන සඳහා ගැළපෙන ස්වර යොදමින් මාත්‍රා 3/3 රිද්ම රටාවට ගැළපෙන තනු නිර්මාණයක් කරන්න.

| | | | |
|---|---|---|---|
| C | F | G | C |
| | | | |
| C | G | G | C |
| | | | |

| | |
|---|---|
| විෂයය :-පෙරදිග සංගීතය | ශ්‍රේණිය :- 11 |
| පාඩම / ඒකකය :-මයිනර් කෝඩ්ස් ගොඩනැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ | |
| ගුරුවරයාගේ නම :-ඩබ් . ඒ. කුමුදු නිශාන්ත | පාසල- අම්/ගලහිටියාගොඩ මහා විද්‍යාලය |

# මයිනර් (minor) කෝඩ්ස් ගොඩනැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ

**Minor chords (1 4 8)**

✶ ඉහත මේජර් කෝඩ්ස් සකස් කළ ආකාරයටම ස්වර 12 පිළවෙලින් ලියන්න.

✶ මයිනර් කෝඩ් එකට අදාළ නම දරන ස්වරයේ සිට 4 වන ස්වරයත් 8 වන ස්වරයත් ඉතිරි ස්වර දෙක වේ.එනම් මයිනර් කෝඩ් සඳහා 1 4 8 සංකල්පය වැදගත් වේ.

උදා :- C Minor chord :- ස රි රි ග ග ම ම/ ප ධ ධ නි නි

1 2 3 4 5 6 7 8 9 10 11 12

ස ග ප

F Minor chord :- ම ම/ ප ධ ධ නි නි ස රි රි ග ග

1 4 8

ම ධ ස

G Minor chord :- ප ධ ධ නි නි ස රි රි ග ග ම ම/

1 4 8

ප නි රි

මේ ආකාරයටම ස්වර 12 සෑම ස්වරයකින්ම ආරම්භ කොට මයිනර් කෝඩ්ස් 12 ක් නිර්මාණය වේ.

## C minor , F minor ,G minor යන කෝඩ්ස් ආශ්‍රිත නිර්මාණ

C minor ස්කේලයට අදාළව නිර්මාණයක් සිදුකිරීමේදී $C^m$ $F^m$ $G^m$ කෝඩ්ස් තුන ප්‍රමාණවත් වන්නේ එම ස්කේලයේ ස්වර $C^m$ $F^m$ $G^m$ කෝඩ්ස් වලට අදාළ ස්වර නියෝජනය කරන බැවිනි.

$C^m$ - ස ග ප — minor කෝඩ්ස් ලිවීමේදී ස්වර සංකේතයේ දකුණු පස ඉහළ කෙලවරේ m අකුර යොදයි.

$F^m$ - ම ධ ස — ස රි ග ම ප ධ නි (C minor ස්කේලය)

$G^m$ - ප නි රි

ඒ අනුව C minor ස්කේලයට අයත් නිර්මාණයකට කෝඩ්ස් යොදන ආකාරය මෙසේය.

| | | | |
|---|---|---|---|
| $C^m$ | $C^m$ | $F^m$ | $C^m$ |
| ස ප ප | ප ධ ප | ම ම - | ගරි සරි නි |
| $G^m$ | $F^m$ | $C^m$ | $C^m$ |
| රි රි - | ම ග රි | ස - - | - - - |
| $C^m$ | $F^m$ | $F^m$ | $F^m$ |
| ප - ප | ධ ස නි | ධ - ප | ම ම - |
| $G^m$ | $C^m$ | $G^m$ | $G^m$ |
| රි - රි | ග ම ග | ම ප - | - - - |

යම් සංගීත නිර්මාණයකට කෝඩ්ස් යොදනු ලබන්නේ එම නිර්මාණයේ ස්කේලයේ ස්වර අනුවයි.එමෙන්ම අදාළ ස්වර ප්‍රස්ථාරයේ විභාගවල ඇති ස්වර,යොදන කෝඩ් එකේ ස්වර සමග ගැළපීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.ස්වර ප්‍රස්ථාරයක විභාගයෙන් විභාගයට කෝඩ් එක බැගින් යෙදීම සාමාන්‍ය ක්‍රමවේදයයි.ඇතැම් විට කෝඩ්ස් දෙකක් වුවද එහි ඇති ස්වර වලට අනුව යෙදිය හැකිය.එහිදී වැඩිම ස්වර ගණනක් නියෝජනය කරන කෝඩ් එක යෙදීමත් ඒ ඒ විභාගය ආරම්භවන හා වැඩි වේලාවක් පවතින ස්වරය ගැන අවධානය යොමු කිරීම වැදගත්ය.

පහත අංක 01 – 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

01.මයිනර් කෝඩ්ස් ලබා ගන්නා නිවැරදි අංක පිළිවෙල වන්නේ,
1. 1 2 3 2. 1 5 8 3. 1 4 8 4. 1 4 5

02.C minor chord එකෙහි යෙදෙන විකෘති ස්වරය වන්නේ, 1. රි 2. ග 3. ධ 4. නි

03. C minor chord එකෙහි යෙදෙන ස්වර වන්නේ,
1.ස ග ප 2. ස ම ප 3. ස ග ප 4.ග ප ස

04.F minor chord එකෙහි යෙදෙන ස්වර වන්නේ,
1.ම ධ ස 2.ම ධ ස 3.ම නි රි 4.ස ග ම

05. G minor chord එකෙහි යෙදෙන ස්වර වන්නේ,
1.ප නි රි 2.ප නි ස 3.ප ධ නි 4.ස ප නි

06.රි ම ධ යන ස්වර ඇතුළත් මයිනර් කෝඩ් එක වන්නේ,
1.$E^m$ 2.$D^m$ 3.$F^m$ 4.$C^m$

07.ම ම ප ධ / මෙම කොටසට ගැළපෙන කෝඩ් එක වන්නේ,
1.F 2.$G^m$ 3.$A^m$ 4.$F^m$

08. ප නි රි යන ස්වර යෙදෙනුයේ,1.$D^m$ 2.$G^m$ 3.$A^m$ 4.$F^m$

09. $C^m$ ස්කේලයට අයත් ස්වර නිවැරදිව ලියා දක්වන්න.

10. C minor , F minor ,G minor යන කෝඩ්ස් තුනෙහි ස්වර වෙන වෙනම ලියන්න.

11. මයිනර් කෝඩ්ස් ඇසුරෙන් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| Chord නාමය | නියමිත ස්වර | අපරදිග ස්වර සංකේත |
|---|---|---|
| ............. | ස ග ප | .............. |
| F minor | | F $A^b$ C |
| G minor | | |
| E minor | | E G B |

12.minor chords සාදන ආකාරය උදාහරණ සහිතව ලියා දක්වන්න.

13. A minor, E minor යන කෝඩ්ස් වල ස්වර ලියා දක්වන්න.

14. ස රි ග / ම - - / ම ප ධ / ග - ස
ප ධ නි/ ප - - / ග රි ග / ස - - මෙම ස්වර ප්‍රස්ථාරයට ගැළපෙන කෝඩ්ස් නිවැරදිව යොදන්න.

15.ස්වර 12 ටම අදාළව මයිනර් කෝඩ්ස් ගොඩනගමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආරම්භක ස්වරය | නම් කිරීම | | 1,4,8 අංකයන්ට අදාළ ස්වර | අපරදිග නාමින් |
|---|---|---|---|---|
| ස | C | C minor | ස + ග + ප | C + $E^b$ + G |
| රි | C# | C sharp minor | | |
| රි | D | | රි + ම + ධ | D + F + A |
| ග | $E^b$ | E flat minor | | |
| ග | E | | | |
| ම | F | | | |
| ම/ | F# | | | |
| ප | G | | | |
| ධ | $A^b$ | | | |
| ධ | A | | | |
| නි | $B^b$ | | | |
| නි | B | | | |

විෂය ඃ පෙරදිග සංගීතය ශ්‍රේණිය ඃ 11 ශ්‍රේණිය

පාඩම/ඒකකය ඃ Harmony සිද්ධාන්තය මත නිර්මාණ කිරීම.

ගුරුවරයාගේ නම ඃ එම්.ඒ.ඩී.තාරන දිනුක පාසල ඃ අම්/හෑගොඩ ශ්‍රී ඉන්දසාර විද්‍යාලය

## Harmony සිද්ධාන්තය මත නිර්මාණ කිරීම.

- ප්‍රධාන නාද මාලාවට(Melody) සමාන්තරව ස්වර සුසංගතව එකවර ගායනය හෝ වාදනය කිරීම **Harmony** නම්වේ. **Chords** ගොඩනැගෙනුයේ **Harmony** සිද්ධාන්තයට අනුව වුවත් **Chords** සඳහා අවම ස්වර 3ක් සුසංයෝග විය යුතු වේ. **Harmony** වීමට ස්වර 2ක් සුසංයෝග වීම ප්‍රමාණවත් වේ. මෙම ස්වර සුසංයෝග වීම ක්‍රමානුකූල ආකාරයකට සිදුවන නිසා ඉතා පහසුවෙන් නිර්මාණය කළ හැකිවේ.
- මෙය බටහිර සංගීතයට අදාළ සංකල්පයන් වුවද නූතනයේදී ව්‍යවහාරික සංගීතය තුළ සරළ ගී, ටෙලිනාට්‍ය ගී, වේදිකා නාට්‍ය ගී තුළ බෙහෙවින් දැකගත හැකිය.
- ගීතයේ නාද මාලාවට අලංකාරයක් ගෙනදීම පිණිස මෙම සංකල්පය භාවිතයට ගනු ලැබේ.
- **Harmony** වන ආකාර කිහිපයක් පැවතියද 3rd, 4th, 5th **Harmony** පිළිබඳ පමණක් මෙහිදී අවධානය යොමු කෙරේ.
- ප්‍රධාන ස්කේලයක් මත පිහිටා මෙම **Harmony** නිර්මාණයේ යෙදීම වඩාත්ම පහසු කාර්යක් වේ. **C Major Scale** එක මත පිහිටා මෙම **Harmony** නිර්මාණය කර ගන්නා ආකාරය පහතින් දැක්වේ.

| C Major Scale ⟶ | ස | රි | ග | ම | ප | ධ | නි | ස̇ |
|---|---|---|---|---|---|---|---|---|
| | C | D | E | F | G | A | B | C |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| | | | ↑ | | ↑ | | | |

❖ යම් **Scale** එකක ස්වර පිළිවෙලින් ගත් කළ තුන්වන ස්වරය මත පිහිටා ස්වර සුසංගත වීම 3rd **Harmony** යැයි හඳුන්වනු ලබයි.

උදාඃ- 3rd **Harmony**

**Melody** ⟶ |ස ස ස රි|ග - - -|රි ම ග රි|ස - - -|
**3rd Harmony** ⟶ |ග ග ග ම|ප - - -|ම ධ ප ම|ග - - -|

මෙම ස්වර පේළි දෙකම එකවර වාදනය කළ විට තනුව හා 3rd **Harmony** මනාව සුසංයෝග වී ඇසෙන බව වටහා ගත හැකිය.

❖ යම් **Scale** එකක ස්වර පිළිවෙලින් ගත් කළ පස්වන ස්වරය මත පිහිටා ස්වර සුසංගත වීම 5th **Harmony** යැයි හඳුන්වනු ලබයි.

උදාඃ- 5th **Harmony**

**Melody** ⟶ |ස ස ස රි|ග - - -|රි ම ග රි|ස - - -|
**5th Harmony** ⟶ |ප ප ප ධ|නි - - -|ධ ස̇ නි ධ|ප - - -|

ඉහත ආකාරයටම මෙම ස්වර පේළි දෙකම එකවර වාදනය කළ විට තනුව හා 5th **Harmony** මනාව සුසංයෝග වී ඇසෙන බව වටහා ගත හැකිය.

❖ ජන ගී ආශ්‍රිත නාද මාලාවලට ඉහත **Harmony** දෙකටම වඩා 4th **Harmony** එකතු කිරීම මගින් වඩා රසවත් වන බව ඩබ්ලිව්.බී. මකුලොලුව ශූරීන්ගේ හා සී.ද.එස්. කුලතිලක ශූරීන්ගේ නිර්මාණ ආශ්‍රයෙන් පෙන්වා දී ඇත.

උදාඃ- 4th **Harmony**

**Melody** ⟶ | + නි̣ස රි රි | රි - ග රි | ස රිස රි ගරි| ස - ස - |
**4th Harmony** ⟶ | + ගම ප ප | ප - ධ ප | ම පම ප ධප| ම - ම - |

මෙම ආකාරයට සිව්වන ස්වරය සුසංයෝග කිරීමෙන් වුවද ගීතයකට Harmony ඉතා අලංකාරව යොදා ගත හැක.මේ අයුරින් ඕනෑම Scale එකක ඇති ස්වර බණ්ඩයක් ගැලපෙන පරිදි Harmony කිරීමෙන් ඉතා අලංකාර නාද මාලාවන් මැවීමේ හැකියාව ඇත.

**නිවැරදි පිළිතුර තෝරන්න.**

1. **Harmony** ක්‍රමය ............................ සිද්ධාන්තයකි.

   (1) පෙරදිග සංගීත (2) ජන සංගීත (3) බටහිර සංගීත (4) හින්දුස්ථානී සංගීත

2. **Harmony** සිද්ධාන්තය මගින්,

   (1) ගීතයේ අරුත වෙනස් වේ. (2) ගීතයේ නාද මාලාව අලංකාර කරයි.

   (3) වැඩි හඬකින් ශ්‍රවණය වේ. (4) බටහිර සංගීත කෘතියක් බවට පත් වේ.

**හිස්තැන් පුරවන්න.**

3. **Chord** සඳහා අවම ස්වර ........ ක් සුසංයෝග වීම අත්‍යාවශ්‍ය වේ.
4. **Harmony** සඳහා ස්වර ........ ක් සුසංයෝග වීම ප්‍රමාණවත්ය.
5. $3^{rd}$ **Harmony** යනු ඕනෑම ස්වරයක සිට ......... ස්වරය සුසංයෝග කිරීමයි.
6. ඕනෑම ස්වරයක සිට පස්වන ස්වරය සුසංයෝග කිරීම ......... වේ.
7. ජන ගී ආශ්‍රිත නිර්මාණයන් සඳහා වඩාත් උචිත වනුයේ ......... ය.

8. |ස ස ග ග|රි රි ග -|ස ස රි රි|ග - - -| මෙයට ගැලපෙන $3^{rd}$ **Harmony** වනුයේ,

   (1) |ග ග ප ප|ම ම ප -|ග ග ම ම|ප - - -| (2) |රි රි ම ම|ග ග ම -|රි රි ග ග|ම - - -|

   (3) |ම ම ධ ධ|ප ප ධ -|ම ම ප ප|ධ - - -| (4) |ප ප නි නි|ධ ධ නි -|ප ප ධ ධ|නි - - -|

9. |ස ම ම ම|ම - - -|ම ධ ප ම|ග - - -| සඳහා සුදුසුම $4^{th}$ **Harmony** වනුයේ,

   (1) |ග ධ ධ ධ|ධ - - -|ධ ස̇ නි̱ ධ|ප - - -| (2) |රි ප ප ප|ප - - -|ප නි ධ ප|ම́ - - -|

   (3) |ම ම නි̱ නි̱|නි̱ - - -|නි̱ රි̇ ස̇ නි̱|ධ - - -| (4) |ප ස̇ ස̇ ස̇|ස̇ - - -|ස̇ ග̇ රි̇ ස̇|නි - - -|

10. |ස ග ග|ම ප ප|ම ග රි|ස ස ස| මෙයට ගැලපෙන $5^{th}$ **Harmony** වනුයේ,

    (1) |ස̇ ග̇ ග̇|ම̇ ප̇ ප̇|ම̇ ග̇ රි̇|ස̇ ස̇ ස̇| (2) |ග ප ප|ධ නි නි|ධ ප ම|ග ග ග|

    (3) |ම ධ ධ|නි ස̇ ස̇|නි ධ ප|ම ම ම| (4) |ප නි නි|ස̇ රි̇ රි̇|ස̇ නි ධ|ප ප ප|

**පහත ප්‍රශ්න වලට අදාල පිළිතුරු සපයන්න.**

01. **Harmony** සිද්ධාන්තය කෙටියෙන් පහදන්න.

02. **Harmony** ක්‍රමය යෙදිය හැකි ක්ෂේත්‍ර කිහිපයක් ලියා දක්වන්න.

03. මෙම ගීතය $3^{rd}$ Harmony යොදා සකස් කරන්න.

**Melody** → |ස ස ම ම|ග ග ම ම|ස ස ම ම|ග ග ම ම|
|ධ ධ ම ම|ප ප ග ග|ම - - ස|රි ග ම -|

04. ඔබ උගත් සරළ ගී නාදමාලාවක පළමු පේළිය $5^{th}$ **Harmony** යොදා සකස් කරන්න.

05. ඔබ උගත් ජන ගී නාද මාලාවක ආවර්ථ දෙකක් $4^{th}$ **Harmony** යොදා සකස් කරන්න.

| | | |
|---|---|---|
| විෂය | :-පෙරදිග සංගීතය | ශ්‍රේණිය:-11 |
| පාඩම් ඒකකය | :-නූර්ති ගීත සහ නාඩගම් ගීත අතර සංගීතමය වෙනස | |
| ගුරුවරයාගේ නම:-බී.ජී.ඒ.සංජීවනී | | පාසල:-අම්/මඩවලලන්ද මහ විදුහල |

<u>නූර්ති ගීත සහ නාඩගම් ගීත අතර ,සංගීතමය වෙනස</u>

| නාඩගම් | නූර්ති |
|---|---|
| උතුරු ඉන්දියානු සංගීතය හෙවත් හිංදුස්ථානී සංගීතයේ ආභාෂය ලැබී ඇත. | දකුණු ඉන්දියානු සංගීතය හෙවත් කර්ණාටක සංගීතයේ ආභාෂය ලැබී ඇත. |
| නූර්ති ගීත සඳහා යොදාගෙන ඇති ගී තනු ඉතා මිහිරියි.එයට හේතු වී ඇත්තේ,උත්තර භාරතීය හිංදුස්ථානී සංගීතය ඇසුරු කර ගනිමින් නූර්ති ගීත වල තනු නිර්මාණය වීමයි. | නාඩගම් යනු ,ගායන වාදන රාශියක් ඇතුළත් වූ රංගනයකි.මෙහි ඇතුළත් වන ගීත පොදුවේ "සිංදු රාග,, යනුවෙන් හඳුන්වන අතර,කර්ණාටක සංගීතය ඇසුරු කර ගනිමින් නාඩගම් ගී තනු නිර්මාණය කර ඇත. |
| විශ්වනාත් ලව්ජී,ජටාශංකර්,අබ්දුල්,සතාර් වැනි උතුරු ඉන්දියානු සංගීතඥයින්ගේ සේවාව ගී තනු නිර්මාණයට ලබාගෙන ඇත. | අලගනායිදු නම් ද්‍රවිඩ සංගීතඥයාගේ සහාය නාඩගම් ගී නිර්මාණයට ලබා ගෙන ඇත. |
| භෛරවී,කාෆි,දේස්,ජෞනපුරි,වැනි හිංදුස්ථානි රාග ඇසුරු කර ගනිමින් ගීත නිර්මාණය | හරිකම්බෝජි,කරහරප්‍රිය,හනුමන්තෝඩි,වැනි කර්ණාටක රාග ඇසුරු කරගනිමින්, නාඩගම් ගීත නිර්මාණය |
| කෙහෙර්වා,දීප්චන්දි,දාදරා,පංජාබි,වැනි හිංදුස්ථානි තාල මත නූර්ති ගීත නිර්මාණය | පසන්,තිර්ලානා.වඩිමොඩි,තංගපාට, ආදිතාල,,යන කර්ණාටක තාල මත නාඩගම් ගීත නිර්මාණය |
| නූර්ති ගීත සඳහා, ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස තබ්ලාව යොදා ගන්නා අතර,සර්පිනාව,වයලීනය, බටනළාව යන සංගීත භාණ්ඩද යොදා ගනී. | නාඩගම් ගීත සඳහා,ප්‍රධාන තාල වාද්‍යය භාණ්ඩය ලෙස, මද්දලය යොදා ගන්නා අතර,මද්දල 2ක් භාවිතා කරමින් වැඩිතාල් සහ අඩුතාල් වශයෙන් භාවිතා කරන අතර,සර්පිනාව,හොරණෑව,වයලීනය, වැනි සංගීත භාණ්ඩ යොදා ගැනීම. |
| නූර්ති ගීත වල ගීතයේ ආරම්භයේ හෝ මැද,තාලයෙන් තොර ,ඇද පැද ළෙලවා ගයන "දොහොරාව,, නම් ගායන විලාසයක් ඇත. | නාඩගම් ගීත වල ඇද පැද ළෙලවා ගැයෙන "අගහාරං,,නම් කොටසක් ඇති අතර,ධ්‍රැත ලයෙන් ගැයෙන උරුට්ටුව නම් කොටසක්ද,ඉන්නිසය නම් දේවාරාධනාවක්ද ඇත. |

● කාර්ය පත්‍රිකාව

වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

01.නාඩගම් සම්ප්‍රදායයෙහි දක්නට නොලැබෙන ගායන අංගයකි.
1.තෝඩායම 2.අගහාරං 3.දොහොරාව 4.ඉන්නිසය

02.නාඩගම් සංගීත සම්ප්‍රදායයෙහි යොදා නොගන්නා සංගීත භාණ්ඩයකි.
1.තබ්ලාව 2.සර්පිනාව 3.වයලීනය 4.මද්දලය

03.උතුරු ඉන්දීය සංගීත ආභාෂය ලැබී ඇති නාට්‍යය සම්ප්‍රදායයකි.
1.වන්නම් 2.ප්‍රශස්ති 3.නාඩගම් 4.නූර්ති

04.නූර්ති සංගීත නිර්මාණය සඳහා සහයට නොගත් පුද්ගලයෙකි.
1.ලයනල් එදිරිසිංහ 2.විශ්වනාත් ලව්ජී 3.ජටා ශංකර් 4.අබ්දුල් අශීස්

05.නූර්ති සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1.දාදරා ,දීප්චන්දි,බෙම්ටෝ ආදී තාල මත ගීත නිර්මාණය 2.තාල වාදනයට තබ්ලාව යොදා ගැනීම.
3.දොහොරාව භාවිතා වේ. 4.කර්ණාටක රාග භාවිතය

06.නාඩගම් තාලයකි.
1.දාදරා 2.දීප්චන්දි 3.බෙම්ටො 4.පසන්

07.ස්ථායි අන්තරා ආකෘතියෙන් යුක්ත ගායන ශෛලියකි.
1.නූර්ති 2.හටන් 3.වංග 4.ප්‍රශස්ති

08.දොහොරාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1.නූර්ති ගීතයන්හි දක්නට ලැබෙන ගායන අංගයකි. 2.නාඩගම්හි දක්නට ලැබෙන ගායන අංගයකි.
3.නාඩගම්හි චරිත හඳුන්වා දීමකි. 4.ධ්‍රැත ලයෙන් ගැයෙන ගායන අංගයකි.

09.මුල් කාලීන නාඩගම්හි ,සංගීත නිර්මාණය සඳහා දායක වූ පුද්ගලයෙකි.

1.අබ්දුල් 2.ජටාශංකර් 3.විශ්වනාත් ලව්ජී 4.අලගනායිදු

10.“රොලීනා හෙවත් දිව්‍ය කුසුම,, යනු
1.කතාන්දරයකි. 2.චිත්‍රපටියකි. 3.නූර්ති නාට්‍යයකි. 4.නාඩගමකි.

● පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

11.නූර්ති සඳහා සංගීතය සැපයූ, උත්තර භාරතීය සංගීත ශිල්පීන් සිව් දෙනෙකු නම් කරන්න.

12.“සිංදුරාග ,,යනු කුමක්ද?

13. නූර්ති සහ නාඩගම් සම්ප්‍රදායයෙහි ඔබ දකින සමාන අසමානතා මොනවාද?

14.උරුට්ටුව,දොහොරාව,අගහාරං,යනු කුමක්දැයි පැහැදිලි කරමින්, එම ගායන ශෛලීන්හි සමාන අසමානතා මොනවාදැයි පැහැදිලි කරන්න.

15.නූර්ති ගීත සහ නාඩගම් ගීත අතර,සංගීතමය වෙනස පැහැදිලි කරමින් වගන්ති 08 ක් ලියන්න.

විෂය :- පෙරදිග සංගීතය | ශ්‍රේණිය :- 11 ශ්‍රේණිය

පාඩම/ඒකකය :- නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම

ගුරුවරයාගේ නම :- එන්. කේ. ඩී. සුභද්‍රා කුමාරි | පාසල :- අම්/රජගලතැන්න මහා විද්‍යාලය

## නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම

නූර්ති රංග ශෛලිය අප රටේ දශක ගණනාවක් පුරාවට ප්‍රචලිත වන්නට හේතු වූයේ සංගීතය ප්‍රධාන වූ නාට්‍යයක් වීමය. උත්තර භාරතීය හින්දුස්ථානි සංගීතයේ අභාසයෙන් පෝෂණය වූ නූර්ති ගී වල එම සංගීතයට සුවිශේෂී බොහෝ ශිල්පාංග දක්නට ලැබුණි. නූර්ති ගීත ඉතා මිහිරි තනු වලින් අනූන විය. එයට මූලික හේතු වන්නේ ගී තනු සඳහා හින්දුස්ථානි සංගීතය මිශ්‍ර වීමය. ඇතැම් නූර්ති ගී වල රාගයක ලක්ෂණ නොතිබුණද විවිධ රාග වල යෙදෙන ස්වර සංගති, ස්වර රටා එකතුවීම මගින් රාගධාරී පසුබිම සැකසී තිබිණි.

- නූර්ති සංගීතය හින්දුස්ථානි රාගධාරී සංගීත සම්ප්‍රදාය තුලින් නිර්මාණය වී ඇති බව පහත සඳහන් නිදසුන් වලින් තහවුරු වේ.
- කාෆි, ඛමාජ්, භෛරවී, යමන්, පිළු වැනි උත්තර භාරතීය රාග ඇසුරු කරගෙන තනු නිර්මාණය වී ඇත.
- දාදරා, කෙහෙර්වා, ඨෙම්ටෝ, දීප්චන්දි වැනි හින්දුස්ථානි සරල තාල ගීත සඳහා යොදා ගෙන ඇත.
- හින්දුස්ථානි ගීත ආකෘතියේ අභාෂය අනුගමනය කරමින් ස්ථායි, අන්තරා ආකෘතියෙන් ගීත සමන්විත වේ.
- සංගීත භාණ්ඩ ලෙස තබ්ලාව, සර්පිනාව ප්‍රධානව උත්තර භාරතීය සංගීත භාණ්ඩ යොදා ගැනීම.



තබ්ලාව



සර්පිනාව



වයලීනය

- විශ්වනාත් ලෞජී, ජටා ශංකර්, අබ්දුල් සතාර් වැනි භාරතීය සංගීතඥයින් ගී තනු සඳහා දායක වීම.
- ඛ්‍යාල් ගායන ශෛලියේ එන ආලාප කොටසට සමානකම් දක්වන දොහොරාව නම් වූ කොටසක් බොහෝ නූර්ති ගීත වල දක්නට ලැබීම.
    - දොහොරාව සඳහා උදාහරණ -:
        - "වාසනා දිනේකි මේක(කෝමල මදුර බයිනි) නූර්ති ගීතයේ එන " කොටස.
- මීන්ඩ්, ගමක්, ඛන්, මුර්කි, තානාලංකාර වැනි උත්තර භාරතීය ශාස්ත්‍රීය රාගාංග යොදාගෙන තිබීම.
    - තානාලංකාර සඳහා උදාහරණ -:
        - සෝභාමාන දේව පුරා

හින්දුස්ථානි රාගාශ්‍රිතව නිර්මාණය වී ඇති ප්‍රචලිත නූර්ති නාට්‍ය.

| ගීතය | ආශ්‍රිත රාගය | නූර්තිය |
|---|---|---|
| සවන්දී පෙර රාම චරිතේ අසව් | බිලාවල්රාගය | රාමායනය |
| රකිනු ඊශ්වරා | කාෆි රාගය | රාමායනය |
| අප ගුණ සරු සිංහල භූපති | භෛරවී රාගය | ශ්‍රී වික්‍රම |
| කවාලා විළඳ ජාති | භෛරවී රාගය | රොඩී කෙල්ල |
| ඇස ප්‍රීති කරන රූපා | යමන් රාගය | මානාභරණ |
| කොහිවේදෝ ලියෝ | භෛරවී රාගය | පද්මාවතී |

පහත සදහන් වන්නේ රාග ආශ්‍රිත නූර්ති ගීත කිහිපයක ආශ්‍රය කරගත් රාගය, තාලය, යෙදී ඇති ස්වර සංගතීන්ය.

| ගීතය | ආශ්‍රය කරගත් රාගය | තාලය | ස්වර සංගතිය |
|---|---|---|---|
| සවන්දී පෙර රාම | බිලාවල් රාගය | දීප්චන්දි | ධ නි ස රි ස නි ධ ප, ග ප පධ ප |
| රකිනු ඊශ්වරා | කාෆි රාගය | දාදරා | රි ප ම ප ග ස, රි ග රි ස |
| අප ගුණ සරු සිංහල | භෛරවී රාගය | කෙහෙර්වා | ස රි ග මග - රි, ධනි - ස - |

භෛරවී රාගය ආශ්‍රිත නූර්ති ගීතයක් -

කවාලා විළඳ ජාතී ඇති කළත් රන් කූඩුවේ ගිරවා
දමාලා යන්නෙ ඉගිලී රැව්දිදී ලබනා සෙ වන සැපතා//

උපන්නොත් යම් කෙනෙක් මෙලොවේ
මරණයත් කොටා ඇත නළලේ
මරණයත් ඇයිද මේ කෙටුවේ
මහ බඹා මනු සතා නළලේ

කවාලා විළඳ ජාතී ඇති කළත් රන් කූඩුවේ ගිරවා
දමාලා යන්නෙ ඉගිලී රැව්දිදී ලබනා සෙ වන සැපතා//

කිරෙන් කා තෙලෙන් අත සෝදා
අපේ මේ ජීවිතේ ගෙවෙනා
දුවන්නේ සිරුරු කූඩුව මෙහි තබාලා
ආවා කළ මරුවා

කවාලා විළඳ ජාතී ඇති කළත් රන් කූඩුවේ ගිරවා
දමාලා යන්නෙ ඉගිලී රැව්දිදී ලබනා සෙ වන සැපතා//

කාර්ය පත්‍රිකාව:-

අංක **1** සිට **5** දක්වා ප්‍රශ්න වල හිස්තැන් පුරවන්න.

1. කොහිවේදෝ ලියෝ .................................. නූර්තියේ ගීයක් වන අතර එහි තනුව .................................. රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇත.
2. නූර්ති ගීත අතරතුර යෙදෙන කාලයෙන් තොර වූ ................................නම් ගීත කොටස හින්දුස්ථානි ඛ්‍යාල් ශෛලියේ එන ................................ ගායනයට සමාන කමක් දක්වයි.
3. ......................... රාගය ආශ්‍රිතව නිර්මාණයවූ ......................... ගීතය තුලින් රිපමපගු, සරිගුරිස යන ස්වර සංගතිය පිලිබිඹු වේ.

4. ............................ නූර්තියේ එන "ඇස ප්‍රීති කරන රූපා ගීතය" .......................... ආශ්‍රය කරගෙන නිර්මාණය වී ඇත.

5. ...................................... සහ ................................... යන ආකෘතියෙන් නූර්ති ගීත සමන්විත වේ.

අංක **6** සිට **8** තෙක් ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ වැරදිය. ඒවා නිවැරදි කර ලියන්න.

6. නූර්ති ගීත බොහෝමයක් පසන්, වාපු, තිර්ලානා වැනි මද්දල් පද ඇසුරු කරගෙන නිර්මාණය කෙරේ.

7. නූර්ති සඳහා දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ අභාසය ලැබී ඇත.

8. විශ්වනාත් ලෞජී, ජටා ශංකර්, අබ්දුල් සතාර් දක්ෂ නාඩගම් රංග ශිල්පීන් වේ.

**9-10** තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

9. නූර්ති ගීත සඳහා යොදා නොගන්නා තාලයකි.

   a. ධමාර්   b. බෙම්ටෝ   c. දාදරා   d. කෙහෙර්වා

10. දොහොරාව යෙදෙන නූර්ති ගීතයකි.

   a. රකිණු ඊශ්වරා   b. දන්න වං හුං   c. වසනා දිනේකි   d. බෝදොස් කියා

**11 - 15** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

11. ශ්‍රී ලාංකිකයන්ගේ රස වින්දනය සඳහා පැවති රංග සම්ප්‍රදායන් අතරින් නූර්ති සංගීතය රසවත් වීමට හේතු වූ කරුණු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

12. රාගධාරී සංගීතය මැනවින් හදාරා ඇති අයෙකුට නූර්ති ගී ගායනාවන් ඉතාමත් රසවත්ලෙස ගයනා කල හැකිය ඉහත කරුණ පාදක කර .ගනිමින් බිත්ති පුවත්පතකට ලිපියක් පිළියෙළ කරන්න.

13. නූර්ති ගීත සඳහා යොදාගත් හින්දුස්ථානි තාල 4ක් නම් කර ඉන් එක් තාලයක් නියමිත තාල සඥා සහිතව ප්‍රස්ථාර කරන්න.

14. රගාශ්‍රිතව නිර්මාණය වූ නූර්ති ගීත 5ක් ආශ්‍රිත රාගය සමග නම් කරන්න.

15. නූර්ති සංගීතය සඳහා යොදා ගන්නා ප්‍රධාන ස්වර හා තාල වාද්‍ය භාණ්ඩ නම් කර ඉන් තාල වාද්‍ය භාණ්ඩයෙහි දළ රූප සටහනක් ඇඳ කොටස් 5ක් නම් කරන්න.

- විෂය - සංගීතය
- ශ්‍රේණිය - 11 ශ්‍රේණිය
- පාඩම/ඒකකය -ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය හා චිත්‍රපට සංගීතයේ සාධනීය අවස්ථා
- ගුරුවරයාගේ නම - තොෂිතා ශ්‍යාමලි අඹේපිටිය
- පාසල - අම්/කාවන්තිස්ස මහ විදුහල ( ජාතික පාසල)

## චිත්‍රපට සංගීතය

❖ චිත්‍රපට සංගීතය වූ කලී,
  - චිත්‍රපට ගීත
  - පසුබිම් සංගීතය
  - තේමා සංගීතය යනුවෙන් ගොඩනැගුන පුළුල් ක්ෂේත්‍රයකි.

❖ චිත්‍ර පටයේ අවස්ථා තීව්‍ර කිරීම සඳහා සංගීතය භාවිතා කරයි.

❖ 1947 දී ශ්‍රී ලංකාවේ චිත්‍රපට කලාව ආරම්භ විය.

❖ මෙය මුල් යුගයේ දකුණු ඉන්දියානු - චිත්‍රපට නිෂ්පාදකයින්/ අධ්‍යාක්ෂකවරුන්
  - සංගීතඥයින්
  - වාදකයින් / ගායකයින්
  - චිත්‍රාගාර පහසුකම් යොදා ගන්නා ලදි.

❖ මුල් යුගයේ දී නිහඩ බව නැති කිරීම සඳහා සංගීතය යොදාගත් බව පෙනේ.
මුල් යුගයේ සංගීත අධ්‍යක්ෂ වරුන්- ටී.ආර්.පාපා , ඒස් දක්ෂින මූර්ති
මුල් යුගයේ ගායක ගායිකාවන් - ජමුණාරානි රාශි / K රාජා, ලතා මංගේෂ්කාර්

❖ ද්‍රවිඩ අනුකරනාත්මක ප්‍රථම සිංහල චිත්‍රපටය කඩවුණු පොරොන්දුව වේ.

## විදේශීය තනු අනුකරණ චිත්‍රපට

| දෙමළ / හින්දි චිත්‍රපටය | ගීතය | සිංහල චිත්‍රපටය | ගීතය |
|---|---|---|---|
| රත්තරන් | පරදේශී බාලා මා බාදල් ආයා | කඩවුණු පොරන්දුව | සන්ධ්‍යාවේ ශ්‍රියා රම්‍යා ලෙස ජේනා |
| තාරණා | තීන් මිලේ තීනු හුවේ බාවරේ | උමතු විශ්වාසය | සුදට සුදේ සිරිය දිලේ |
| ජාල් | අක්නිකහෝ කුච් මේරිසුනෝ | කැලෑ හඳ | අන්න සුදෝ අර පාටවලා |
| අම්බර් | හම්තුම් හේ බහාර් | සුජාතා | පෙම් රැල්ල නැගී |
| ශ්‍රී 240 | රමෛයා වසා වසා | දෛව විපාකය | සාගර හිමිය සොයා |

❖ 1957න් ඇරඹි දෙවන දශකයේ දේශීය අධ්‍යාක්ෂකවරුන්, නිෂ්පාදකවරුන් විසින් චිත්‍රපට නිර්මාණය කරන ලදි.

❖ රේඛාව චිත්‍රපටයේ සංගීතමය අවස්ථානුරූපි සංගීතයක් යොදා ගෙන ඇත.

❖ 1967න් ඇරඹි තෙවන දශකයේදී චිත්‍රපට කර්මාන්තය දියුණු විය.

❖ දේශීය නිර්මාණ කරුවන් දායකත්වය ලබා දී ඇත.

❖ මේ යුගයේදී චිත්‍රපට කලාවේ ස්වර්ණමය යුගයයි.

❖ ශ්‍රී ලංකාවේ ප්‍රථම වර්ණ චිත්‍රපටය රන්මුතුදූව චිත්‍රපටයයි.

චිත්‍රපට සංගීතයේ සාධනීය අවස්ථා

| සංගීත අධ්‍යක්ෂවරයා | චිත්‍රපටය | ගීතය | ගායනය |
|---|---|---|---|
| මොහොමඩ් ගවුස් | අශෝකමාලා | ශාන්ත මේ රාත්‍රියේ<br>ප්‍රීති | භාගෘරතී සහ පිරිස<br>භාගෘරතී |
| ආර් මුත්තුසාමි | මාතලන් | උපත ලබා මේ ලෝකේ<br>රන්වන් දූල්<br>සඳරාහු මුඛයේහී | ධර්මදාස වල්පොල<br>ලතා වල්පොල<br>K රාණි |
| ආනන්ද සමරකෝන් | සුජාතා<br>සැඩසුලං | මනරංජන දර්ශනීය ලංකා<br>මා ප්‍රියාදර ජයභූමි | K රාණි<br>ලතා මන්ගොෂ්කාර් |
| බී.එස්. පෙරේරා | පෙරකදෝරු බෑනා | ආදර නදිය ගලා | රුක්මණීදේවි හා<br>මොහිදීන්බෙග් |
| සුනිල් ශාන්ත | රේඛාව | ඕලු නෙලුම්<br>වෙසක් කැකුළු<br>සුදු සඳ එළියේ | සිසිර සේනාරත්න<br>ඉන්ද්‍රාණි<br>සේනාරත්න |

පසුකාලීන චිත්‍රපට සංගීතඥයින් හා සංගීත අධ්‍යක්ෂ කළ චිත්‍රපට

| සංගීතඥයා | චිත්‍රපටය |
|---|---|
| ප්‍රේමසිරි කේමදාස | දූලිකා |
| සෝමදාස ඇල්විටිගල | සත්සමුදුර |
| වික්ටර්රත්නායක | හුලවාලී |
| W.D.අමරදේව | රන්මුතුදූව /ගැටවරයෝ |
| සරත් දසනායක | ඒක්ටැම්ගේ |

ඉහත සටහන කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. චිත්‍රපට සංගීතය යන්න හඳුන්වන්න.
2. චිත්‍රපට සංගීතයේ ඇති සුවිශේෂීයත්වය කුමක්ද?
3. ශ්‍රී ලාංකීය චිත්‍රපට කලාව ආරම්භ වූ වර්ෂය කුමක්ද?
4. මුල් යුගයේ චිත්‍රපට කර්මාන්තය හැදී වැඩී පෝෂණය වූයේ කුමන සංගීත අනුකරණයකින්ද?
5. මුල් යුගයේ චිත්‍රපට සඳහා සංගීතයෙන් දායක වූ සංගීතඥයින් දෙදෙනෙකු නම් කරන්න.
6. මුල් යුගයේදී ගායනයෙන් දායක වූ ඉන්දීය ගායිකාවන් දෙදෙනෙකු නම් කරන්න.
7. දෙමළ චිත්‍රපට අනුකරණයෙන් නිර්මාණය වූ දේශීය චිත්‍රපට දෙකක් නම්කරන්න.
8. ප්‍රථම සිංහල චිත්‍රපටය කුමක්ද?
9. ප්‍රථම වර්ණ චිත්‍රපටය කුමක්ද?
10. දේශීය චිත්‍රපට කලවේ ස්වර්ණමය යුගය ආරම්භ වූ වර්ෂය කුමක්ද?
11. චිත්‍රපට සංගීතය නව ආරක වෙනසකට බඳුන් කළ සිංහල ප්‍රථම චිත්‍රපටය නම් කර එහි සංගීතය චිත්‍රපට සංගීතයේ සංධිස්ථානයක් වීමට තුඩුදුන් හේතු දක්වන්න.
12. චිත්‍රපට සංගීත කලාවේ ස්වතන්ත්‍ර තනු නිර්මාණකරණයෙහි යෙදුණු සංගීතඥයින් තිදෙනෙකු නම්කර , ඔවුන් නිර්මාණය කරන ලද ගීතද පෙළ ගස්වන්න. එම ගීත ඇතුළත් චිත්‍රපට නම් කරන්න.
13. ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික සංගීතය උදෙසා චිත්‍රපට සංගීතයේ බලපෑම පහත සඳහන් කරුණු වලට අදාලව පැහැදිලි කරන්න.

    I.ආරම්භය, දකුණු ඉන්දියානු බලපෑම, .ස්වාධීන සංගීත නිර්මාණ , ගායක ගායිකාවන්

14. චිත්‍රපට සංගීතයේ වර්තමාන ස්වරූපය හා උන්නතිය සඳහා කටයුතු කළ යුතු ආකාරය විමසන්න.
15. චිත්‍රපට ගී මෙරට ජනයාගේ සංගීත රසිකත්වය වර්ධනය කළ අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න

- විෂය - සංගීතය ● ශ්‍රේණිය - 11 ශ්‍රේණිය
- පාඩම/ඒකකය - රේඛාව චිත්‍රපටය හා සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය
- ගුරුවරයාගේ නම - තොෂිතා ශ්‍යාමලී අබේපිටිය ● පාසල - අම්/කාවන්තිස්ස මහ විදුහල (ජාතික පාසල)

## රේඛාව චිත්‍රපටය

❖ ස්වාධීන ගී තනු සහ පසුබිම් සංගීතය රැගත් මුල්ම සිංහල චිත්‍රපටය.
❖ සිංහල චිත්‍රපටයට සිංහල සලකුණ සටහන් වූ ප්‍රථම චිත්‍රපටය.
❖ ගී පද සරල වීම.
❖ ගී තනු සරල වීම.
❖ ශුද්ධ ස්වර ඇසුරු කොට ගී තනු නිර්මාණය කර තිබීම.
❖ විරිදු පන්තියක් ඇතුළත් වීම.
❖ සුනිල් ශාන්තයන්ගේ නිර්මාණ කෞෂල්‍යා විහිදා දක්වන සරල හා දේශීයත්වයට නැඹුරු සංගීතයෙන් පෝෂණය වීම.
❖ චිත්‍රපට අධ්‍යක්ෂණය - ලෙස්ටර් ජේම්ස් පීරිස්
❖ සංගීත අධ්‍යක්ෂණය - බී.ඇස්.පෙරේරා
❖ ගී තනු නිර්මාණය - සුනිල් ශාන්ත
❖ ගී පද රචනය - මර්සලින් ජයකොඩි පියතුමා
❖ ගායක ගායිකාවෝ - අයිවෝ ඩෙනිස්, ලතා වල්පොල,ඉන්ද්‍රාණි විජේබණ්ඩාර,සිසිර සේනාරත්න,තිලකසිරි ප්‍රනාන්දු
❖ තිරගත වූ වර්ෂය - 1956
❖ ඇතුළත් වූ ගීත - ඕලු නෙලුම් නෙරිය රඟලා, සුදු සඳ එළියේ,වෙසක් කැකුළු,මිණි මුතු පයට,අනුරාපුර පොළොන්නරුව

## සත්සමුදුර චිත්‍රපටය

❖ 1947න් ඇරඹි දේශීය චිත්‍රපට කර්මාන්තයේ දෙවෙන දශකය තුළ බිහිවූ සුවිශේෂී සංගීත නිර්මාණ ප්‍රතිභාවක් විදහා දක්වන චිත්‍රපටයකි.
❖ චිත්‍රපට අධ්‍යක්ෂණය - මහාචාර්ය සිරි ගුණසිංහ
❖ සංගීත අධ්‍යක්ෂණය - සෝමදාස ඇල්විටිගල
❖ ගී තනු නිර්මාණය - සෝමදාස ඇල්විටිගල
❖ ගී පද රචනය - මහගම සේකර, සිරි ගුණසිංහ
❖ ඇතුලත් ගීත - සිනිඳු සුදු මුදු තලාවේ,පිපුණු කුසුම පරවූවා
❖ ගායික ගායිකාවෝ - පණ්ඩිත් අමරදේව ඇතුළු පිරිස
❖ තිරගත වූ වර්ෂය - 1967
❖ සංගීතමය තොරතුරු
  - චිත්‍රපට තේමාව සමග සංගීතය මනා ලෙස බද්ධ වීම.
  - චිත්‍රපට තේමා ගීතය මගින් ගීතයකට වඩා සංධ්වනියක මෙන් වාද්‍ය සංගීත ලක්ෂණ මතු වීම.
  - සමූහ වාදන ශෛලිය භාවිතය.
  - වාද්‍ය භාණ්ඩ රැසක් භාවිතයට ගැනීම.
  - ස්වර සංකලනයේදී විවිධ රටා යොදා ගැනීම.
  - සංගීතය මතු කිරීම සඳහා කටහඬ අර්ථානුරූපීව යොදා ගැනීම.

❖ සංගීත භාණ්ඩ යොදා ගැනීම
  - වයලීන්,වියෝලා,චෙලෝ,ඩබල් බේස්,සන්තූර්,සිතාර්,ඉංග්ලිෂ් මැන්ඩලීන්,ගිටාර් ආදී තත් භාණ්ඩ, බටනලා,ඕබෝ සුසිර භාණ්ඩ,පියානෝ,තබ්ලාව,සිම්බල් ආදී සමාඝාත භාණ්ඩ

❖ හින්දුස්ථානි සංගීතයේ ශිල්ප ක්‍රම භාවිතය
  - දොහොරා භාවිතය
  - ආලාප භාවිතය
  - කෙහෙර්වා, රූපක් වැනි තාල පද

❖ බටහිර සංගීත ශිල්ප ක්‍රම භාවිතය
  - පිසිකාටෝ,හාර්මනී,කෝඩ්ස්,කවුන්ටර් පොයින්ට්ස්

ඉහත ඡේදය කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. සිංහල චිත්‍රපටයට සිංහල සලකුණ සටහන් වූ ප්‍රථම චිත්‍රපටය කුමක්ද?

02. රේඛාව චිත්‍රපටයේ අධ්‍යක්ෂකවරයා කවුරුන්ද?

03. රේඛාව චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂකවරයා හා ගී තනු නිර්මාණකරුවා කවුරුන්ද?

04. රේඛාව චිත්‍රපටයේ ගී පද රචනය කළේ කවුරුන්ද?

05. රේඛාව චිත්‍රපටයෙන් පසු ලංකාවේ චිත්‍රපට සංගීතයේ ඇති වූ වෙනස්කම් 03ක් ලියන්න.

06. රේඛාව චිත්‍රපටයේ ඇතුළත් ගීත 02ක් නම් කරන්න.

07. රේඛාව චිත්‍රපටයේ ඇතුළත් ගීතවල සුවිශේෂී තොරතුරු 5ක් ඇතුළත් කෙටි හැඳින්වීමක් කරන්න.

08. සත් සමුදුර චිත්‍රපට අධ්‍යක්ෂකවරයා කවුරුන්ද?

09. සත් සමුදුර චිත්‍රපටයේ සංගීතය නිර්මාණය කිරීමේදී වැඩි වශයෙන් ආභාෂ ලබා ගෙන ඇති සංගීත සම්ප්‍රදාය කුමක් ද ?

10. සත් සමුදුර චිත්‍රපටය සඳහා යොදාගෙන ඇති බටහිර සංගීත ශිල්ප ක්‍රම 04ක් ලියන්න .

11. සත් සමුදුර චිත්‍රපටයේ සංගීත නිර්මාණය සඳහා යොදාගෙන ඇති තත් වාද්‍ය භාණ්ඩ හා සුසිර වාද්‍ය භාණ්ඩ තුන බැගින් ලියන්න .

12. සත් සමුදුර චිත්‍රපට සංගීතය සඳහා යොදාගෙන ඇති සමාඝාත භාණ්ඩ 02ක් ලියන්න.

13. සත් සමුදුර චිත්‍රපටය සංගීතය සඳහා යොදාගෙන ඇති හින්දුස්ථානි සංගීත ශිල්ප ක්‍රම මොනවාද

14. සත් සමුදුර චිත්‍රපටයේ තොරතුරු ආශ්‍රයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| තිරගත වූ වර්ෂය | |
| චිත්‍රපට අධක්ෂණය | |
| ගී තනු නිර්මාණය | |
| සංගීත අධක්ෂණය | |
| ගී පද රචනය | |

15. සිනිඳු සුදු මුදු තලාවේ ගීයට අදාළ වන සුවිශේෂී සංගීතමය ලක්ෂණ 04ක් ඇතුළත්ව කෙටි හැඳින්වීමක් කරන්න .

- විෂය - සංගීතය
- ශ්‍රේණිය - 11 ශ්‍රේණිය
- පාඩම/ඒකකය - සොකරි සංස්කෘතික පසුබිම හා ගීත ගායනය
- ගුරුභවතාගේ නම - ඒ.ඒ.ආර්.ජයෝමි
- පාසල - අම්/උක්සිරිපුර විද්‍යාලය

සොකරි සංස්කෘතික පසුබිම.

## සොකරි හැඳින්වීම.

ගැමියා අතරෙහි දීර්ඝ කාලයක සිට පැවත එන විනෝදාස්වාදය අරභයා පවත්වනු ලබන ගැමි නාටක විශේෂයක් ලෙස සොකරි හැඳින්විය හැකිය. සොකරි නාට්‍ය උඩරට, වන්නි හා බදුල්ල ප්‍රදේශ වල ප්‍රචලිතය. සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් ගැමියා වාර්ෂිකව පවත්වා ඇත.

## සොකරි කතා පුවත

ගුරුහාමි (ගුරුන්නාන්සේ) , සොකරි හා පරයා පදිංචිය සඳහා ශ්‍රී පාදස්ථානය වැඳ පුදා ගැනීම සඳහා ලංකාවට පැමිණ තඹරාවිට ගම වාස භූමිය කරගනී. දිනක් ගුරුහාමි බල්ලෙකු විසින් සපා කෑම හේතු කොටගෙන පසුව ඔහුට වෙදකම් කිරීම සඳහා කැඳවන තඹරාවිට වෙදරාළ සොකරි සමඟ රහසිගතව පළා යයි. පේන බලන අය විසින් පෙන්වන මග ඔස්සේ ඇය සොයා යන ගුරුහාමි, වෙදරාළ සමඟ සිටින ඇය ආපසු කැඳවාගෙන විත් සියලුදෙනාම සාමදානයෙන් ජීවත් වෙති.
සොකරි නාට්‍යයේ කතා පුවත ප්‍රාදේශීය වශයෙන් වෙනස්කම් සහිතය.

## සොකරි නාට්‍යවල විශේෂ ලක්ෂණ

- ❖ සොකරි නාට්‍ය සඳහා එක් එක් ප්‍රදේශ වශයෙන් වාදන භාණ්ඩ භාවිතයේ දී බොහෝ පළාත් වල

  - උඩරට- ගැටබෙරයද ,
  - වන්නි ප්‍රදේශ වල - උඩැක්කිය ද ,
  - ඌව ප්‍රදේශයේ -දවුල ද

  ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගැනේ. ඊට අමතරව තාලම්පට , හොරණෑව යන භාණ්ඩ ද යොදා ගෙන ඇත.

- ❖ සොකරි නාට්‍යයේ රංගභූමිය "කමත " වේ.
- ❖ ගුරුන්නාන්සේ ගයන සෑම කවි පෙළක්ම අත්වැල් ගායකයින් ගායනා කිරීම.
- ❖ කමතට පැමිණෙන සියලුම චරිත හඳුන්වා දෙන්නේ ගුරුන්නාන්සේ මඟිනි.
- ❖ හාස්‍ය මුසුකොටගත් අවස්ථා බොහෝ ඇත.

❖ මෙම නාට්‍ය පෙන්වීමේ අරමුණු වන්නේ,

I. මිනිසුන්ට වැළඳෙන වසංගත රෝගවලින් ආරක්ෂා වීම.
II. සතුන්ට වැළඳෙන රෝගවලින් මුදවා ගැනීම.
III. වගාවන් සරුකර ගැනීම (සශ්‍රීකත්වය)
IV. සෞභාග්‍ය උදාකර ගැනීම.
V. පත්තිනි දෙවියන් ඇදහීමට ආරම්භ වූ පූජෝත්සවයකි. එහි ස්ත්‍රියක් සතු පතිවත රැකීමේ අවශ්‍යතාවයත් ,පතිවත රැකීම නිසා ඇය කෙරේ ඇතිවන බලයත් මෙම නාටකය තුළින් විග්‍රහ කෙරේ.
VI. එසේම කතරගම දෙවියන් ඇදහීම මෙහි අරමුණු කොටගෙන ඇත.
VII. හාස්‍ය රසයෙන් පිරි සොකරි නර්තනයක් රඟ දැක්වීමෙන් හා නැරඹීමෙන් ගැමියෝ මහත් වූ ආස්වාදයක් ලැබූහ. ඒම නිසා විනෝදාස්වාදය අරමුණු කර ගෙන රඟ දක්වනු ලැබූ බව තහවුරු වේ .

❖ ඇතැම් නළුවන් වෙස් මුහුණු පැළඳීම.

❖ ප්‍රධාන චරිත වලට අමතරව කාලි අම්මා, සොත්තානා, හෙට්ටියා, කපුරාළ, වඩුරාළ වැනි චරිත සිටීම.

## සොකරි නාට්‍ය වල රඟ දක්වන චරිත

සොකරි නාටකයේ ආඩිගුරු හෙවත් ගුරුහාමි ,සොකරි, පරයා, වෙදරාළ යන චරිත ප්‍රධාන චරිතය වේ. මෙම චරිත වල ස්වභාවය එකිනෙකට වෙනස් වේ. චරිත වලට ආවේණික වූ ගමන් තාල , අංග ලක්ෂණ , බෙරපද , කවි ගායනා , නර්ථන විධි, ඉදිරිපත් කරනු ලැබේ.

01. ගුරුහාමි:-



ගුරුහාමි යනු ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයෙන් පැමිණි තැනැත්තෙකු ලෙස හැදින්වේ. මොහු තරමක් වයස්ගත පුද්ගලයෙක් වේ. මොහුට සිංහල බස කතා කිරීමට ඇති අපහසුතාවය දෙබස් මගින් ඉදිරිපත් කෙරේ. සිංහල වචන වැරදි ලෙස උච්චාරණය කිරීම නිසා මොහු අකරතැබ්බයන්ට මුහුණ දෙයි. ඒවා හාස්‍ය උපදවන්නට හැකි අවස්ථාවන් වේ.

02. සොකරිය :-



සොකරි නාටකය තුළ රඟ දක්වන ප්‍රධානතම කාන්තා චරිතය සොකරි වේ. ඉතා රූමත් තරුණියකි. ඇයගේ ගමන කලාත්මක ය. ලයාන්විත ය. ශෘංගාරාත්මක ය. සොකරි නාටකය තුළ දී කතා නොකරන බැවින් බොහෝවිට බිම බලාගෙන ඇස් වලින් ඉඟි බිඟි පාමින් රංගනයේ යෙදේ.

03. පරයා :-



සොකරියගේ හා ආඬිගුරුගේ අතවැසියා වන පරයා , මුඛරි බසින් යුක්තය . ගුරුහාමිත් ප්‍රේක්ෂකයාත් සම්බන්ධ කිරීමට අතරමැදි වන චරිතය ලෙස පරයා හැඳින්විය හැකිය . මොහු විකට ස්වරූපයෙන් යුක්ත වේ. ප්‍රේක්ෂකයාට සිනහව උපද්දවන්නට සමත් චරිතයකි . බෙර තාලයට අනුව උඩ පනිමින් අතපය විසි කරමින් හාස්‍ය උපදවන ලෙස චරිතය නිරූපණය කරයි.

<u>සොකරි කවිය</u>

සොකරි එන්නේ සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ලැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මූණ බලන්නී

❖ 1 සිට 5 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

1. සොකරි නාට්‍ය සඳහා භාවිතා කරන රංගභූමිය කුමක්ද?

i. කරළිය ii. තානායම් පොළ iii. කමත Iv.රංග මණ්ඩපය

2. සොකරි යනුවෙන් හඳුන්වන්නේ,

i. උඩරට සාම්ප්‍රදායික ගැමි නැටුමකි.

ii. උඩරට සාම්ප්‍රදායික ජන නැටුමකි.

iii. උඩරට හා සබරගමු ගැමි නැටුමකි.

iv. උඩරට සාම්ප්‍රදායික ගැමි නාටකයකි.

3. ගුරුහාමි, වෙදරාළ යන චරිත ඇතුළත් ගැමි නාටක විශේෂය කුමක්ද?

i. රූකඩ ii. සොකරි iii. කෝලම් Iv.නාඩගම්

4. සොකරි නාට්‍ය සඳහා යොදා ගන්නා සංගීත භාණ්ඩයකි.

i. වයලීනය ii.බටනළාව iii. ගිටාරය Iv.හොරණෑව

5. සොකරි නාට්‍ය සඳහා පළඳින්නේ,

i. වෙස් මුහුණුය ii.වළලුය iii. ගෙජ්ජිය Iv.ආභරණය

❖ 06 සිට 10 තෙක් ඇති වාක්‍ය සඳහා හිස්තැනට සුදුසු වචනය යොදන්න.

6. සොකරි නාට්‍ය ප්‍රචලිත ප්‍රදේශයකි .........................

7. මෙම නාට්‍ය පෙන්වීමේ අරමුණක් ලෙස .................................. උදාකර ගැනීම පෙන්වාදිය හැක.

8. චරිත හඳුන්වා දෙන්නේ ............................. විසිනි.

9. ගුරුන්නාන්සේ ගයන සෑම කවි පෙළක්ම .................................... ගායකයින් ගායනා කරයි.

10. ................................ මුසුකොටගත් අවස්ථා සොකරි නාටකවල ඇත.

❖ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

11. සොකරි නාට්‍ය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

12. සොකරි කවියක් ලියා දක්වන්න.

13. සොකරි කතා පුවත කෙටියෙන් ලියන්න.

14. සොකරි නාට්‍යවල ප්‍රධාන චරිතයට අමතරව දැකිය හැකි චරිත තුනක් නම් කරන්න.

15. සොකරි නාට්‍ය වල එන ගුරුහාමි , සොකරිය, පරයා යන චරිත තුන කෙටියෙන් හඳුන්වන්න.

විෂය :- පෙරදිග සංගීතය | ශ්‍රේණිය 11
පාඩම /ඒකකය :- Music Recording & Using Multy Track
ගුරුවරයාගේ නම :- එන් එම් අමිල එරංග සුගතදාස | පාසල :- අම්/උහන ජාතික පාසල

- වර්තමානය වන විට පරිගණකය සංගීත නිර්මාණ කරණයෙහිලා වැදගත් ස්ථානයක් ගනී.
- මුල් වකවානුවල ගීතයක් හෝ යම් නිර්මාණයක් එළි දැක්වීමට මහත් පරිශ්‍රමයක් දරන්නට සිදුව ඇත .
- ශබ්දාගාර පහසුකම් නොමැතිවීම නිසා ගැටළු රාශියකට මුහුණ දෙන්නට සිදුවිය .
- මුල් කාලයේ දී ගීත රෙකෝඩින් කිරිම සදහා භාවිතා කරන ලද්දේ ටේප් පටියයි එම නිසා එවා පටිගත කිරිම ලෙස ව්‍යවහාර කරයි.



- අතීතයේ දි ගීතයක් හෝ යම් නිර්මාණයක් කිරීමේ දී සියළුම වාද්‍ය ශිල්පීන් හා ගායකයින් එකවර සිටිය යුතුවිය.
- එක් අයෙකුට හෝ යම් වැරැද්දක් සිදුවුවහොත් නැවත සම්පූර්ණයෙන්ම ගිතය පටිගත කළ යුතුය.
- ශබ්දාගාර පහසුකම් නොමැතිවීම නිසා රාත්‍රී කාලයේ දී බොහෝ පටිගත කිරිම් සිදුවිය එයට හේතුව වන්නේ රාත්‍රී කාලයේ දී අවට පරිසරයෙන් ඇසෙන ශබ්ද අඩු නිසාවෙනි.
- කාලයත් ශ්‍රමයත් මුදලත් අපතේ යාම මෙමගින් සිදුවිය.
- පරිගණකය හා තාක්ෂණය අතින් ඉහළ මෘදුකාංග ලොවට හදුන්වා දීමත් සමග ගීත පටිගත කිරිම වෙනුවට හඩ සටහන් කිරිම (Recording) ආරම්භ විය. මෙසේ රෙකෝඩ් කරගන්නා සංගිත ඛණ්ඩ අන්තර්ගත කිරිම නොහොත් ගබඩා කිරිම Hard Disk එකක් මත සිදුවිය.



- සජීවිව සංගීත භාණ්ඩ වාදනය කරමින් ගිත රෙකෝඩ් කිරිමට සහ පරිගණකයේ මෘදුකාංග හරහා සංගීත භාණ්ඩ වාදනය කර ගීත නිර්මාණය කිරිම සදහා වෙන වෙනම මෘදුකාංග සකස් විය.

- සජීවිව සංගීත භාණ්ඩ වාදනය කරමින් පරිගණකය හරහා රෙකෝඩින් කිරිම සදහා වෙළද පොළේ මෘදුකාංග රාශියක් දක්නට ලැබේ. ඒවා අතර **Adobe Audition,Cubase,Nuendo,pro tools, Studio One,sound Forge,Azid pro, cakewalk**

  - පරිගණකය තුළ ස්ථාපනය කොට ඇති මෘදුකාංග ඇසුරින් සංගීත ඛන්ඩ නිර්මාණය කිරිමේ හැකියාව ද ඇත . මෙසේ නිර්මාණය කරන සංගීත ඛන්ඩ පරිගණක සංගිතය ඇසුරින් නිර්මාණය කරන ලද ගණයට ගැනේ.
  - එවැනි මෘදුකාංග අතර **Fl Studio(Fruty Loops), Reason,Abelton Live**

  - ඇතැම් මෘදුකාංග ඉහත සදහන් ක්‍රම දෙකටම රෙකෝඩින් කිරිමේ හැකියාව ඇත . එනම් ද්විත්ව ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරයි. එම මෘදුකාංග අතර **Cubase,Nuendo,pro tools** පෙන්වා දිය හැක.

- ගිතයක් රෙකෝඩින් කිරිම සදහා සපුරා ගත යුතු අවම උපකරණ කීපයකි ඒවා නම්

  - Microphone ( මයික්‍රෆෝනයක්)
    හඩ ග්‍රහණය කර ගැනිම මෙමගින් සිදුවේ.



  - Headphone(හෙඩ්ෆෝනයක්)
    ගිතයත් රෙකෝඩ් කර ගැනිමේ දී  අනෙකුත් සංගීත ඛණ්ඩ ඇසෙන්නේ මෙමගින්ය.

  - Sound card ( හඩපතක්)
    සංගිත කොටස් හෝ නාදයන් පරිගණකය තුලට ගෙන ඒම හා පරිගණකය තුළ ඇති ගීත හෝ නාද පිටතට රැගෙන එන්නේ මෙමගින්ය. මෙයට හඩ පත යැයි ද කියනු ලබයි.





  - Audio Cable ( ඕඩියෝ කේබල්)
    Microphone මගින් හඩ ග්‍රහණය කර Sound Card එක වෙත ගෙනයැම හා සංගීත භාණ්ඩ වලින් නිපදවෙන නාද Sound Card එක වෙත ගෙනයැම මෙමගින් සිදුවේ.

## Multi Track Recording

- ➢ එක් එක් භාණ්ඩය වෙන වෙනම රෙකෝඩින් කිරීම මේ නමින් හඳුන්වයි.
- ➢ නිර්මාණය සඳහා  දායක වන වාදකයින් වයන නාද වෙන වෙනම රෙකෝඩින් කරනු ලබයි.
- ➢ මේ නිසා එවා වෙන වෙනම ඇසිය හැක සංස්කරණය කළ හැක හඩ අවශ්‍ය පරිදි අඩු වැඩි කළ හැක.
- ➢ පරිගණකය රෙකෝඩින් කිරිම සදහා සම්බන්ධ වීම තුළ ඉහත වාසි අපට ලැබී ඇත .
- ➢ MIDI (MUSICAL INSTRUMENT & DIGITAL INTERFACE) යන්න ආගමනයත් සමග **රෙකෝඩින් කිරිම සදහා මහගු** දායකත්වයක් මෙමගින් ලැබුනි.



- ➢ ඒ සදහා සකසන ලද සංගීත ගොනු (Sound Font) **දක්නට ලැබේ.**

NEXUS

- ➢ සංගිත ගොනු යනු සංගීත භාණ්ඩ වල නාදය රෙකෝඩ් කර ඒවා ස්වර  අනුපිළිවෙළ අනුව සකසා MIDI තාක්ෂණය සහිත කීබෝඩ් එකක් හරහා හැසිරවිය හැකි නාද පෙළයි.



- ➢ VST(Vertual Studio Technology)**තාක්ෂණයත් සමග විවිධ සංගීත භාණ්ඩ,** විවිධ Effect වෙළද පොළේ දක්නට ඇත .

















- ➢ මූලික වශයෙන් පරිගණකයක මෘදුකාංග භාවිතයෙන් සංගීත නිර්මාණයක් කිරීමේ දී පහත සදහන් පියවර අනුගමනය කළ යුතුවේ.
    - Compose(නිර්මාණය කිරිම)
    - Record(රෙකෝඩින් කිරිම)
    - Mix(සංයෝජනය කිරිම)
    - Export(Audio File එකක් ලෙස මෘදුකාංගයෙන් පිටතට ගැනිම)

## 01 සිට 05 දක්වා ප්‍රශ්ණ සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 රෙකෝඩින් කිරීම සඳහා පරිගණකය භාවිතා කරමින් දත්ත ගබඩා කරන ලද්දේ,

1 Central prosser unit එක මතය 2 Moniter එක මතය 3 Mother Board එක මතය 4 Hard Disk එක මතය

02 හඩ ග්‍රහණය කර ගැනීම සඳහා උපයොගී කරගන්නා උපකරණයකි

1 Moniter 2 MIDI 3 Sound Card 4 Microphone

03 **Multi Track Recording** යනු,

1 පරිගණකය හරහා ගීත රෙකෝඩින් කිරීම

2 සියළුම සංගීත භාණ්ඩ එක **Track** එකක් මත රෙකෝඩින් කිරීම

3 සංගීත භාණ්ඩ වෙන වෙනම රෙකෝඩින් කිරීම

4 මේ කිසිවක් නොවේ

04 **Reason,Fl Studio** වැනි මෘදුකාංග

1 සජීවිව සංගීත භාණ්ඩ වාදනය කරමින් රෙකෝඩ් කිරීම සඳහා නිර්මාණය වූ මෘදුකාංග වේ.

2 මෘදුකාංග තුළ ඇති සංගීත භාණ්ඩ වාදනය කරමින් නිර්මාණ කිරීම සඳහා නිර්මාණය වූ මෘදුකාංග වේ.

3 වයලින් බටනලා වැනි සංගීත භාණ්ඩ වාදනය සඳහා නිර්මාණය වූ මෘදුකාංග වේ.

4 ටේප් රෙකොඩින් සඳහා නිර්මාණය වූ මෘදුකාංග වේ.

05 ද්විත්ව ක්‍රියාකාරීත්වයක් ඇති මෘදුකාංගයක් නොවන්නේ,

1 Cubase 2 Pro tools 3 Reason 4 Nuendo

## 06 සිට 10 දක්වා ප්‍රශ්ණ සඳහා හිස්තැන් පුරවන්න.

06 ද්විත්ව ක්‍රියාකාරීත්වයක් ඇති මෘදුකාංග 02ක් වන්නේ .................................. ..................................

07 පරිගණක සංගීතය සඳහාම පමණක් සැකසුණු මෘදුකාංග 02කි .................................. ..................................

08 අතීතයේ දී ගිත .................................. සිදු කරන ලදි.

09 නූතනයේ දී ගීත .................................. කර ගබඩා කරන ලද්දේ.................................. ..............එකකටය.

10 Nexus. Real Guiter යනු .................................................... උදාහරණයකි.

## 11 සිට 13 දක්වා ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.

11 මූලික වශයෙන් පරිගණකයක මෘදුකාංග භාවිතයෙන් සංගීත නිර්මාණයක් කිරීමේ දී අනුගමනය කළ යුත පියවරයන් මොනවාද?

12 MIDI තාක්ෂණය පිළිබද සැකවින් දකවන්න.

13 ගිතයක් රෙකෝඩින් කිරීම සඳහා සපුරා ගත යුතු අවම උපකරණ මොනවාද?

14 Multy Track Recording යන්න කෙටියෙන් පහදන්න.

15 අතීතයේ දී ගීත පටිගත කිරීම හා නූතනයේ ගීත රෙකොඩින් කිරීම අතර වෙනස්කම් හා වාසි අවාසි පිළිබද සාකච්ඡා කරන්න.

| |
|---|
| විෂය-. පෙරදිග සංගීතය |
| ශ්‍රේණිය-. 11 ශ්‍රේණිය |
| පාඩම/ඒකකය-. විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාර කරනයේ යෙදේ. |
| ගුරු භවතාගේ නම-. J A D චම්පික සරත් කුමාර. |
| පාසල- අම්/බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල, අම්පාර |

## Scale

- Tone එකක් = සම්පූර්ණ ස්වරයෙකි.(1)

  Semi tone එකක් = අර්ධ ස්වරයකි (1/2)

- major scale එකක් නිර්මාණය වන අයුරු
  tone + tone + semitone + tone + tone + tone + semitone
  මෙම සිද්ධාන්තය අංක මගින් පැහැදිලි කරන්නේ නම්
  1+1+ ½ +1+1+1+ ½

- minor scale එකක් නිර්මාණය වන අයුරු
  Tone + semitone + tone + tone + semitone + tone + tone
  මෙම සිද්ධාන්තයේ අංක මගින් පැහැදිලි කරන්නේ නම්
  1 + ½ +1 +1 + ½ + 1 + 1

C major scale – C D E F G A B C
ස රි ග ම ප ධ නි ස

C minor scale – C D E♭ F G A♭ B♭ C
ස රි <u>ග</u> ම ප <u>ධ</u> <u>නි</u> ස

F major scale – F G A B♭ C D E F
ම ප ධ <u>නි</u> ස රි ග ම

F minor scale – F G A♭ B♭ C D♭ E♭ F
ම ප <u>ධ</u> <u>නි</u> ස <u>රි</u> <u>ග</u> ම

G major scale – G A B C D E F# G
ප ධ නි ස රි ග ම' ප

G minor scale – G A B♭ C D E♭ F G
ප ධ <u>නි</u> ස රි <u>ග</u> ම ප

B♭ major scale – B♭ C D E♭ F G A B♭
<u>නි</u> ස රි <u>ග</u> ම ප ධ <u>නි</u>

B♭ minor scale –. B♭ C D♭ E♭ F F# A♭ B♭
<u>නි</u> ස <u>රි</u> <u>ග</u> ම ම' <u>ධ</u> <u>නි</u>

## scale පරිවර්තනය කර ප්‍රස්තාර ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- අදාල ස්කේලයට අයත් ස්වර පිළිබඳ දැනුම.
  උදා - c major scale – C D E F G A B C
- ස්වර පුවරුව නිවැරදිව දැනගෙන සිටීම.
- Tone, semitone ක්‍රමවේදය පිළිබඳ දැනුම.

★ පහත සඳහන් ස්වර ප්‍රස්තාරය C major scale වලින් ලියා ඇත. එය F major scale වලට හරවා ලියූ විට

ස ස ග ග | රි රි ග _ | ස ස රි රි | ග _ _ _
ස _ රි _ | ග _ ම _ | ග _ රි _ | ස _ _ _

F major scale වලින් දැක්වූ විට

C scale _ ස රි ග ම ප ධ නි ස

F scale _ ම ප ධ නි ස රි ග ම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ස | රි | ග | ම | ප | ධ | නි | ස |
| ම | ප | ධ | නි | ස | රි | ග | ම |

ම ම ධ ධ | ප ප ධ _ | ම ම ප ප | ධ _ _ _
ම _ ප _ | ධ _ නි _ | ධ _ ප _ | ම _ _ _

ප්‍රශ්න

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. F minor scale වලට අයත් වනුයේ

   i. F G A B♭ C D E♭ F
   ii. F G A B C D E F
   iii. F G A♭ B♭ C D♭ E♭ F
   iv. F G A B♭ C D E F

2. Tone එකක් යනු.,

   i. අර්ධ ස්වරයකි.
   ii. සම්පූර්ණ ස්වරයකි.
   iii. සම්පූර්ණ ස්වර දෙකකි.
   iv. ස්වර 1 ½ කි.

3. semitone තුනක් යනු,

i. Tone දෙකකි.
ii. Tone එකකි.
iii. Tone 2 ½ ..
iv. Tonr 1 ½ .

4. B♭ major scale වලට අයත් නොවන ස්වරයකි.

i. C
ii. E♭
iii. A♭
iv. G

5. "ස රි ග _"යන ස්වර 4 F major scale වලින් ලියා ඇති අතර එය f major scale එකට පරිවර්තනය කිරීමේදී

i. ම ප ධ -
ii. ම ප නි -
iii. ම් ප ධ -
iv. ග රි ස -

- හිස්තැන් පුරවන්න.

6. ප ධ - - - - ම ප වශයෙන් G major scale වල ස්වර භාවිත වේ.

7. G minor scale වල ඇති flat notes වනුයේ,——,——.

8. Tone+Tone+Tone. මෙහි ඇති ස්වර ගණන වන්නේ______________ය.

9. major scale අංක මගින් පැහැදිලි කිරීමේදී 1+1+ ½ +1+ _ + _ + _ ලෙස දැක්වේ.

10. c major scale වල sharp සහ flat note දක්නට_______________.

- කෙටි පිළිතුරු ලියන්න.

11. scale පරිවර්තනයේදී ඔබ හොඳින් දැනගත යුතු කරුණු දෙකක් ලියා දක්වන්න.

12. major scale එකක් නිර්මාණය වන සිද්ධාන්තය අංක මගින් පැහැදිලි කරන්න.

13. minor scale එකක් නිර්මාණය වන ආකාරය tone,semitone වලින් ලියා දක්වන්න.

14. "ස" ස්වරයේ සිට "ම" ස්වරය දක්වා ඇති Tone ගණන කොපමණද?

15. පහත සඳහන් ස්වර ප්‍රස්තාරය c major scale වලින් ලියා ඇත. එය F major, B major සහ G major යන (මධ්‍යම, පංචම, කෝමළ නිෂාධ භාවයෙන්) scale වලට හරවා ලියා දක්වන්න.

| ග _ ම | ප _ ග | ම _ ග | රි _ _ |

| ග _ ම | ප _ ධ | නි _ _ | _ _ _ |